# භූනියම හා ජ්‍යෝතිෂ්‍ය නීති පිළිබඳ පණිවිඩයක්

ح جمعية الدعوة و الارشاد وتوعية الجاليات بالربوة ، ١٤٤٥ هـ

فهرسة مكتبة الملك فهد الوطنية أثناء النشر

عبدالعزيز بن باز،

حكم السحر والكهنة - سمهالي. / عبدالعزيز بن باز؛

-ط١..- الرياض ، ١٤٤٥هـ

٦٤ ص ؛ ١٤ × ٢١ سم

ردمك: ٩٧٨-٦٠٣-٨٤١٧-٣٣-١

١٤٤٥ / ١٠٤٨٥

شركاء التنفيذ:

دار الإسلام | جمعية الربوة | رواد الترجمة | المحتوى الإسلامي

يتاح طباعة هذا الإصدار ونشره بأي وسيلة مع الالتزام بالإشارة إلى المصدر وعدم التغيير في النص.

Telephone: +966114454900

ceo@rabwah.sa

P.O.BOX: 29465

RIYADH: 11557

www.islamhouse.com

# පෙරවදන

සියලු ප්‍රශංසා අල්ලාහ් සතුය. ශාන්තිය හා සමාදානය ධර්ම දූතයාණන්හටත්, එතුමාණන්ගේ පවුලේ උදවියහටත්, එතුමාණන්ගේ සහගාමීන්හටත්, එතුමාණන්ව අනුගමනය කළ උදවියහටත් අත්වේවා!

ඇත්තෙන් ම හූනියම යනු මහා පාපයන්ගෙන් එකකි. එමෙන් ම වැළකී සිටිය යුතු යැයි අල්ලාහ් නියෝග කළ විනාශකාරී කරුණු හතෙන් එකකි. වර්තමානයේ හූනියම් හා සාස්තර පැතිර පවතී. විවිධ ස්වරූපයන්ගෙන් හා නොයෙකුත් ක්‍රමවලින් ඒවා හෙළි වී ඇත. විටෙක එය විනෝදාස්වාදයේ නාමයෙන් ත්‍රාසජනක චිත්‍රපටවල දක්නට ලැබේ. තවත් විටෙක තපස්භව හා හාස්කම් යන කඩතුරාව යටතේ දක්නට ලැබේ. තවත් විටෙක ආගමික රැකවරණය යන මුවාවෙන් දක්නට ලැබේ. තවත් විටෙක ජන වෙදකම, ඖෂධ වෙදකම යන නාමයෙන් දක්නට ලැබේ. මේවා හැර නූගත් අයගෙන් සහ ආගම පිළිබඳ අවබෝධයක් නැති අයගෙන් සැඟවී යන තරමට වෙනත් විවිධාකාර ස්වරූපයන් දක්වා ම එය ව්‍යාප්තව පවතී.

සෞදි අරාබි රාජ්‍යයේ පොදු ආගමික කටයුතු නීති විශාරද ජ්‍යෙෂ්ඨ විද්වතුන්ගේ කවුන්සිලයේ, විද්‍යාත්මක පර්යේෂණ හා ආගමික තීන්දු ප්‍රකාශනය කිරීමේ කාර්යාලයේ සභාපති ගරු අබ්දුල් අසීස් බින් අබ්දුල්ලා බින් බාස් (අල්ලාහ් ඔහුට කරුණා කරත්වා!) තුමාගේ පොතෙහි ඇතුළත් හූනියම් පිළිබඳ නීති, ඒ ගැන අවවාදයෙන් කටයුතු කිරීම, සාස්තර කරුවන් වෙත යාමේ නීති යනාදිය අල් කුර්ආන් හා පිවිතුරු නබි පිළිවෙත් පදනම් කර ගත් ආගමික මූලාශ්‍ර සහිතව ඉතා

පහසු ක්‍රමවේදයකින් මෙම පොත පිළියෙළ කර ඇති බැවින්, එය දුටු පුණ්‍යාධාර, ප්‍රචාරක, මාර්ගෝපදේශන හා ඉස්ලාම් ආගමික කටයුතු අමාත්‍යාංශය විසින් මෙම පොත මුද්‍රණය කර බෙදා හැරීමට කටයුතු කරන ලදි.

හූනියම් පිළිබඳ නීති, හූනියම් කරුවන් හා සාස්තර කරුවන් වෙත යාමේ නීති පැහැදිලි කිරීමේ දී එතුමාගේ මේ උදාර පොත් පිංචය භාග්‍යලත් එතුමාගේ උත්සාහයක කොටසක් ලෙස සැලකේ. ජනයා යහපත වෙත ඇරයුම් කිරීම, ආගමික අවබෝධය ලැබීම, නීති පැහැදිලි කිරීම, පිළිකුල් සහගත දැයින් වැළකී සිටීම, ඒ ගැන අනතුරු ඇඟවීම, මුස්ලිම්වරුන්ට උපදෙස් දීම, ශුද්ධ වූ අල්ලාහ්ගේ ග්‍රන්ථය හා ඔහුගේ පිවිතුරු නබිවරයාණන්ගේ සුන්නාව පිළිපැදීම සඳහාත් දැහැමි පෙරගමන්කරුවන්ගේ පිළිවෙත මත ගමන් කිරීම සඳහාත් ජනයා ඇරයුම් කිරීම යනාදී කරුණු මෙන් ම මේ හැර ව්‍යාජ ප්‍රතිපත්ති සංකල්ප, ගුරු කුලයන් හා චින්තනයන්ගෙන් ඉවත් වීම සඳහා මෙහි දායකත්වය බහුල ලෙස උපකාරී වේ.

මෙම ආශීර්වාද ලත් දේශය සහ එහි නිවැරදි නායකත්වය ගමන් කරනුයේ ඒ මතය. උත්තරීතර අල්ලාහ් ඒමත ම එය ස්ථිර කරත්වා! ඒ සඳහා වන උපකාරය, ආශිර්වාදය හා ශක්තිය යනාදී සාධක එයට සැළසුම් කර දෙත්වා! මෙම පොත් පිංචය සංස්කරණය කළ ගරු මහාචාර්ය ෂෙය්ක්තුමාට යහපත් ප්‍රතිඵල හිමිවේවා! ඉමහත් කුසල් හිමිවේවා!

මෙය කියවන; එයට සවන් දෙන; එය පරිශීලනය කරන දනන් හට මෙමඟින් ප්‍රයෝජන ලැබේවා! අල් කුර්ආනය හා සුන්නාව අනුව කටයුතු කිරීම සඳහා අප සියලු දනන්හට මග පෙන්වා දෙත්වා! ෂෙයිතාන්ගේ විකාරයන්, ඔහුගේ මං මාවත්වලින් අප ආරක්ෂා කරත්වා! යැයි අපි අල්ලාහ්ගෙන් ඉල්ලා සිටිමු. සැබැවින් ම ඔහු එයට භාරකරුය. ඒ මත බලය දරන්නාය. ඍජු මාර්ගය වෙත මග පෙන්වන්නා අල්ලාහ්ය. අපගේ නබි මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් කෙරෙහි ද, එතුමාගේ පවුලේ ඥාතීන් හා හිතමිතුරන් යනාදී සියලු දනන් කෙරෙහි ද, අල්ලාහ්ගේ ශාන්තිය හා සමාදානය අත්වේවා!

අබ්දුල්ලාහ් ඉබ්නු අබ්දුල් මුහ්සින් අත්-තුර්කී
පුණ්‍යාභාර, ප්‍රචාරක, මාර්ගෝපදේශන හා ඉස්ලාම් ආගමික කටයුතු පිළිබඳ අමාත්‍ය.

# හූනියම හා ජෝතිෂ්‍ය පිළිබඳ නීති මෙන් ම ඒ හා බැඳුණු කරුණු.

සියලු ප්‍රශංසා අල්ලාහ් සතුය. ශාන්තිය හා සමාදනය එතුමාණන්ගෙන් පසු වෙනත් නබිවරයකු නොමැති නබිවරයාණන් මත හිමිවේවා!

මෑත කාලයේ වෙදකම යන මැයෙන් තර්ක කර හූනියම් හෝ ජෝතිෂ්‍ය මඟින් ප්‍රතිකාර කරන මන්ත්‍රකරුවන් අධිකව දක්නට ලැබේ. ඔවුහු ඇතැම් ප්‍රදේශවල ව්‍යාප්තව සිටින අතර, අඥාන අසරණ ජනයා සූරාකමින් සිටිති. මෙම කරුණු සැලකිල්ලට ගෙන මෙහි අල්ලාහ් නො වන වෙනත් කරුණු සම්බන්ධ වී ඇති බැවින් හා ඔහුගේ නියෝගයට හා ඔහුගේ දූතයාණන්ගේ නියෝගයට පටහැනිව කරුණු පිහිටා ඇති බැවින් ඉස්ලාමයට හා මුස්ලිම්වරුන්ට මෙහි ඇති භයානකකම අල්ලාහ් වෙනුවෙන් ඔහුගේ ගැත්තන්හට පැහැදිලි කිරීමට මම අදහස් කළෙමි.

උත්තරීතර අල්ලාහ්ගෙන් උදව් පතමින් මම මෙසේ පවසා සිටිමි: විද්වතුන්ගේ ඒකමතික මතයට අනුව රෝගයක් සඳහා ප්‍රතිකාර ගැනීමට අවසර ඇත. අභ්‍යන්තර රෝග හෝ වේවා, ශල්‍යකර්ම රෝග හෝ වේවා, ස්නායු රෝග හෝ වෙනත් රෝග හෝ වේවා, වෛද්‍යවරයකු වෙත යෑම මුස්ලිම්වරයකු සතු වගකීමකි. වෛද්‍ය විද්‍යාවේ ඔහු ලබා ඇති දැනුම අනුව රෝගය හඳුනාගෙන නීත්‍යානුකූලව අවසර ලත් ඖෂධවලින් ඔහුට ගැළපෙන පරිදි එයට ප්‍රතිකාර කරනු ඇත. එය පොදු සාධක මඟින් ගනු ලබන ප්‍රතිකාරයක් විනා අල්ලාහ් මත වූ විශ්වාසය නැති කරන්නක් නො වේ. උත්තරීතර අල්ලාහ් රෝග පහළ කර ඇති අතර ඒ සමග ම ඒ සඳහා වූ ප්‍රතිකාර ද,

පහළ කර ඇත. එය දන්නා අය ද, ඒ ගැන වැටහීමක් නොමැති නො දන්නා අය ද සිටිති. නමුත් සුවිශුද්ධයාණන් ගැත්තන්හට තහනම් කළ දෑහි ඔහු ඔවුනට සුවය ඇති නො කළේය.

හූනියම් කරුවන් කවර කරුණක් දන්වා සිටින්නේ ද, එය සත්‍ය බව පිළිගැනීම සුදුසු නො වන්නාක් මෙන් ම ඔවුන්ට ගුප්ත දෑ පිළිබඳ දැනුම ඇතැයි වාද කරන්නන් වෙත රෝගියෙකු තම රෝගය ඔවුන්ගෙන් දැනගනු පිණිස ඔවුන් වෙත යෑම ද, සුදුසු නො වන්නේය. ඔවුන් එසේ ගුප්ත දෑ ගැන කතා කරනුයේ අනුමානයෙනි. එසේ නැතහොත් ඔවුන් සිතන දෑ සඳහා ඔවුනට උදව් කරනු පිණිස ජින් හෙවත් අග්නි භූතයකු කැඳවා ගනිමිනි. මොවුන් ගුප්ත දෑ පිළිබඳ දැනුම සම්බන්ධයෙන් තර්ක කරන විට ඔවුන්ගේ නීතිය ඔවුන් දේවත්වය ප්‍රතික්ෂේප කළ මුළා වී ගිය අය යන්නයි.

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්‍රකාශ කළ හදීසයක් සහීහ් මුස්ලිම්හි මුස්ලිම්තුමා විසින් මෙසේ වාර්තා කර ඇත. **"කවරෙකු හෝ සාස්තරකාරයෙකු වෙත පැමිණ ඔහුගෙන් යමක් විමසා සිටියේ ද, ඔහුගේ දින හතළිහක සලාතයන් පිළිගනු නො ලබන්නේ මය."** නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා පැවසූ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. **"කවරෙකු සාස්තර කාරයකු වෙත පැමිණ ඔහු පවසන දෑ සත්‍යක් බව තහවුරු කර සිටියේ ද, සැබැවින් ම ඔහු මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා වෙත පහළ කළ දෑ ප්‍රතික්ෂේප කළේය."** මෙය අබූ දාවුද්තුමා විසින් වාර්තා කර ඇති අතර හදීස් කලාවේ ප්‍රධාන ඉමාම්වරු සිව් දෙනා ද, මෙය දන්වා ඇත.

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාගේ පහත සඳහන් ප්‍රකාශය ඉමාම් අල්හාකිම්තුමා පූර්ව සාධක සහිත හදීසයක් බව දන්වා සිටියි. **“කවරෙකු සාස්තර කාරයකු වෙත හෝ ජෝතිෂ්‍ය වේදියකු වෙත හෝ පැමිණ ඔහු පවසන දෑ සත්‍යක් බව තහවුරු කර සිටියේ ද, සැබැවින් ම ඔහු මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා වෙත පහළ කළ දෑ ප්‍රතික්ෂේප කළේය.”** අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමා ප්‍රකාශ කළ බව ඉම්රාන් ඉබ්නු හුසෙයින් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. **“අශුභවාදය ගැන විමසන්නා හා එසේ ඔහුට අශුභවාදය ගැන පවසන්නා හෝ අනාවැකි ගැන විමසන්නා හෝ එසේ ඔහුට අනාවැකි ගැන පවසන්නා හෝ හූනියම ගැන විමසන්නා හා එම හූනියම ඔහුට සිදු කරන්නා යනාදීන් ද, ජෝතිෂ්‍ය වේදියෙකු වෙත පැමිණ ඔහු පවසන දෑ සත්‍ය බව පවසන්නා ද, යන කිසිවකුත් අප අතරින් නො වන්නේය. සැබැවින් ම ඔහු මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා වෙත පහළ කරන ලැබූ දෑ ප්‍රතික්ෂේප කළේය.”** මෙය මනා වාර්තා සම්බන්ධතාවකින් යුතු ව ඉමාම් අල්-බස්සාර්තුමා වාර්තා කර ඇත.

මායාකරුවන් හෝ ජෝතිෂ්‍ය වේදීන්, අනාවැකි පවසන්නන් හා එවැනි වෙනත් අය වෙත යෑමෙන් ද, ඔවුන්ගෙන් ඒවා විමසා සිටීමෙන් ද, ඔවුන් සත්‍ය බව පවසා සිටීමෙන් ද, වැළකී සිටින මෙන් මෙම ශුද්ධ වූ හදීස්වල සඳහන් වී ඇති අතර ම ඒ ගැන අවවාද කර ඇත. එසේ හූනියම් සිදු කරන අනාවැකි කියන්නන් හෝ එවැනි වෙනත් අය වෙත යෑමෙන් වැළැක්විය හැකි එමෙන් ම බලය යෙදවිය හැකි කටයුතුභාර උදවිය, විමර්ශනය කරන උදවිය හා එවන් අනෙකුත් බලධාරීන්හට අනිවාර්යය වන්නේය. ව්‍යාපාරික ස්ථානවල දී හෝ වෙනත් ස්ථානවල දී හෝ එවන්

යමක් ගනුදෙනු කරනු දකින්නට ලැබෙන්නේ නම් එය වැළැක්විය යුතු වේ. දැඩි සේ ඔවුන් හෙළා දැකිය යුතු වේ. එමෙන් ම ඔවුන් වෙත පැමිණෙන අයව ද, හෙළා දැකිය යුතු වේ.

ඇතැම් කටයුතුවල දී ඔවුන්ගේ සත්‍යතාව හේතුවෙන් හෝ ඔවුන් වෙත පැමිණෙන් අධික ජනයා හේතුවෙන් රැවටී යාම සුදුසු කාරණාවක් නො වන්නේය. සැබැවින් ම ඔවුහු අඥානයෝ වෙති. ඔවුන් විසින් ජනයා රැවටී යාම සුදුසු නො වන්නේය. අල්ලාහ්ගේ දූතයාණන් ඔවුන් වෙත යෑමත්, ඔවුන්ගෙන් කරුණු විමසා සිටීමත්, ඔවුන් සත්‍ය බව තහවුරු කර සිටීමත්, තහනම් කළේය. එය මහා නපුරු, බරපතල අනතුරු හා දරුණු ප්‍රතිවිපාක එහි ඇති බැවින් හා ඔවුන් දුෂ්ඨ බොරුකාරයින් වන බැවිනි. එමෙන් ම හූනියමකරුගේ හෝ ජෝතිෂ්‍ය වේදියෙකුගේ දේව ප්‍රතික්ෂේපය පෙන්වා දෙන සාධකයක් ද, මෙහි ඇතුළත් වේ. එය ඔවුන් ගුප්ත දෑ පිළිබඳ තර්ක කරමින් සිටින බැවිණි. එය දේව ප්‍රතික්ෂේපයකි. එමෙන් ම ඔවුන් ඔවුන්ගේ අරමුණු වෙත ජින්වරුන්ගේ සේවය තුළින් හා අල්ලාහ් හැර දමා වෙනත් අයට ගැතිකම් කිරීම තුළින් මිස ළඟා නො වන බැවිණි. එය අල්ලාහ්ව ප්‍රතික්ෂේප කිරීමකි. එමෙන් ම ඔහුට කරන ආදේශයකි. ඔවුන් ගුප්ත දෑ ගැන කරන වාදයෙහි ඔවුන් සත්‍ය බව තහවුරු කරන්නා ද, ඔවුන් හා සමාන වන්නේය. මේ සමඟ ගනුදෙනු කරන සෑම කෙනෙකුගෙන් ම අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසලල්ම්) ඉවත් විය. ප්‍රතිකර්මයක් යැයි සිතමින් තඹ පත් මත ලියා එල්ලීම හෝ මතුරා වතුර ඉසීම වැනි ඔවුන් සිදු කරන මිත්‍යාදෘෂ්ටික ක්‍රියාවන්ට යටත් වීම මුස්ලිම්වරයකුට සුදුසු නැත. සැබැවින් ම එය ද, හූනියම් අතරින් එකක් වන අතර ජනයා ඇන්දවීමකි.

කවරෙකු එය පිළිගන්නේ ද, ඔවුන්ගේ ව්‍යාජ හා ඔවුන්ගේ දේව ප්‍රතික්ෂේපය සඳහා ඔහු ඔවුනට උරදුන් අයකු වන්නේය.

එමෙන් ම මුස්ලිම්වරුන්ගෙන් කිසිවකුට ඔවුන් වෙත ගොස් තම පුතා හෝ තම ඥාතියෙකු විවාහ කර ගන්නේ කවුරුන් ද? යන්න හෝ අඹු සැමියන් අතර හා ඔවුන් දෙදෙනාගේ පවුල් අතර ඇති ආදරය හා පක්ෂපාතීත්වය හෝ සතුරුකම් හා වෙන්වීම යනාදි කරුණු ගැන හෝ විමසීමට ද, අවසර නැත. ඊට හේතුව එය උත්තරීතර සුවිශුද්ධ අල්ලාහ් හැර වෙනත් කිසිවකු නො දන්නා ගුප්ත දෑ අතරින් වන බැවිණි.
හූනියම යනු දේව ප්‍රතික්ෂේපිත තහනම් කරනු ලැබූ කරුණු අතරින් එකකි. සූරා අල් බකරාවෙහි මලක්වරුන් දෙදෙනෙකුගේ විෂයයෙහි උත්තරීතර අල්ලාහ් මෙසේ පවසා සිටියි. **"... නමුත් ඔවුන් දෙදෙනා 'සැබැවින් ම අපි පරීක්ෂණයකි. එබැවින් නුඹ දේවත්වය ප්‍රතික්ෂේප නො කරනු'යි පවසමින් මිස කිසිවෙකු ට ඉගැන්නුවේ නැත. එවිට ඔවුන් දෙදෙනාගෙන් සැමියා හා තම බිරිය අතර වෙන් කරන කරුණු ඉගෙන ගනිති. අල්ලාහ්ගේ අනුබල යෙන් මිස කිසිවෙකු ට කිසිවකින් හානි පමුණුවන්නන් ලෙස ඔවුන් නැත. තවද, ඔවුන ට හානි පමුණුවන ප්‍රයෝජනවත් නො වන කරුණු ද, ඉගෙන ගනිති. තවද, සැබැවින් ම එය මිල ට ගත් අය ට පර ලොවෙ හි කිසිදු කොටසක් නොමැති බව සැබැවින් ම ඔවුහු දැන සිටියෝය. ඔවුන් විකුණා මිල දී ගත් දෑ නපුරු විය. ඔවුන් (මේ ගැන) දැන සිටියේ නම්."**

සැබැවින් ම හූනියම දේවත්වය ප්‍රතික්ෂේප කිරීමක් බවත් හූනියම් කරුවන් අඹු සැමියන් අතර වෙන් කරන බවත් මෙම පාඨය පෙන්වා දෙයි. එමෙන් ම එම හූනියම එහි පැවැත්මෙන් කිසිදු සෙතක් හෝ

හානියක් හෝ ඇති නො කරන බවත් පෙන්වා දෙයි. එසේ යම් බලපෑමක් ඇති වන්නේ පූර්ව නියමයේ වූ අල්ලාහ්ගේ අනුමැතියෙනි. යහපත මෙන් ම අයහපත මැව්වේ උත්තරීතර අල්ලාහ්ය. දේවත්වය ආදේශ කරන්නන්ගෙන් මෙම දැනුම උරුමකරගත් බොරු කාරයින් සඳහා වූ දෙසුම දරුණු විය. හානිය ද, ඉතා බරපතලය. ඔවුහු එමගින් බුද්ධිහීනයන් ව්‍යාකූලත්වයට පත් කළෝය. සැබැවින් ම අපි අල්ලාහ් වෙනුවෙන් වූ අය වෙමු. ඔහු වෙත ම යොමු වන්නෝ වෙමු. අල්ලාහ් අපට ප්‍රමාණවත්ය. භාරකරුවන ඔහු යහපත්ය.

එමෙන් ම හූනියම හදාරන්නෝ එසේ හදාරා සිටියේ ඔවුනට සෙත නො සලසන හානි පමුණුවන දෑය. සැබැවින් ම ඔවුනට අල්ලාහ් අභියස කිසිදු කොටසක් නැත. (කිසිදු පංගුවක් හෝ භාග්‍යයක් හෝ නැත.) මෙම දැඩි අවවාදය මෙලොවෙහි හා මතුලොවෙහි ඔවුන්ගේ අලාභහානිය කෙතරම් දරුණු දැයි පෙන්වා දෙයි. සැබැවින් ම ඔවුහු ඔවුන්ව නොවටිනා මිලකට විකුණා දැමුවෝය. එබැවින් අල්ලාහ් පවසන පරිදි **“ඔහු ඔවුන් අවමානයට ලක් කළේය. ඔවුන් විකුණා මිල දී ගත් දෑ නපුරු විය. ඔවුන් (මේ ගැන) දැන සිටියේ නම්.”** මෙහි මිල දී ගැනීම යනු විකුණා දැමීම යන අර්ථයෙන් අර්ථවත් වේ.

හූනියම් කරුවන්, සාස්තර කරුවන් මෙන් ම අනෙකුත් මන්ත්‍ර ගුරුකම් කරන්නගේ හානියෙන් ආරක්ෂාව හා සුවය අල්ලාහ්ගෙන් පතමු. එමෙන් ම ඔවුන්ගේ හානියෙන් මුස්ලිම්වරුන් ආරක්ෂා කරන මෙන් ද, මුස්ලිම්වරුන්ගේ කටයුතු මෙහෙයවන බලධාරීන් ඔවුන්ගෙන් වැළකී සිටීමටත්, ඔවුන්ගේ හානියෙන් හා ඔවුන්ගේ මෙම නපුරු ක්‍රියාවන්ගෙන් ගැත්තන් සැනසුම ලබන තෙක් ඔවුන් විෂයයෙහි

අල්ලාහ්ගේ තීන්දුව ක්‍රියාත්මක කිරීමටත්, ආශිර්වාද කරන මෙන් අපි සුවිශුද්ධයාණන්ගෙන් ප්‍රාර්ථනා කර සිටිමු. සැබැවින් ඔහු මහා ත්‍යාගශීලීය. ධනපතිය.

හූනියම ඇතිවීමට පෙර එහි නපුරෙන් ආරක්ෂාව පැතිය යුතු දෑ අල්ලාහ් තම ගැත්තන් හට ආගමානුගත කළේය. එමෙන් ම එසේ බලපෑමට පත්වීමෙන් පසු එයින් සුව වන දෑ ද, සුවිශුද්ධයාණන් ඔවුනට පැහැදිළි කළේය. එය ඔවුනට ඔහුගෙන් වූ දයාවක් උපකාරයක් මෙන් ම ඔවුන් කෙරෙහි වූ ඔහුගේ ආශිර්වාදය සම්පූර්ණ කිරීමක් වශයෙනි.

පහතින් සඳහන් වන්නේ හූනියමෙන් ඇති වන අනතුර, එය බලපැවැත්වීමට පෙර එයින් ආරක්ෂාව සලසා ගන්නා හා එය බලපැවැත්වීමෙන් පසු සුව කර ගන්නා ආගමානුගත අනුමත කරුණුය.

**හූනියමෙන් ඇතිවන අනතුර, එය බලපැවැත්වීමට පෙර එයින් ආරක්ෂාව සලසා ගන්නා කරුණු වනාහි,** එය වඩාත් වැදගත් මෙන් ම වඩාත් ප්‍රයෝජනවත් කරුණකි. එනම්: ආගමානුගත කරන ලද දෛනිකව පවසන දික්ර් හෙවත් මෙනෙහි කිරීම් දුආ හෙවත් ප්‍රාර්ථනා හා තඅව්වුස් හෙවත් රැකවරණය ලබන ප්‍රාර්ථනා තුළින් ආරක්ෂාව ලැබීමය. ඒ අතරින් සෑම අනිවාර්යය සලාතයකට පසුව ම සලාම් කීමෙන් පසු ආගමානුගත කළ දික්ර් හෙවත් අනුවාද පැවසීමෙන් පසු ආයතුල් කුර්සී පාරායනය කිරීමය. එමෙන් ම නින්දට යන අවස්ථාවේ දී ද, එය පාරායනයි කිරීමය. ආයතුල් කුර්සී යනු අල් කුර්ආනයේ ඇති ඉතා බලගතු පාඨයකි. එම අල්ලාහ්ගේ වදන මෙසේය. **"අල්ලාහු ලාඉලාහ ඉල්ලාහුවල් හයියුල් කයියූම් ලා තඃහුදුහු සිනතුන් වලා නව්ම්, ලහූ මා ෆිස්සමාවාති වමා ෆිල්-අර්ලි මන් දල්ලදී යෂ්ෆඋ ඉන්දහු ඉල්ලා බි**

**ඉද්නිහි, යඃලමු මා බයින අයිදීහිම් වමා කල්ෆහුම්, වලා යුහීතූන බි ෂෙයිඉන් මින් ඉල්මිහි, ඉල්ලා බිමාෂාඅ, වසිඅ කුර්යිසියියුහුස් සමාවාති වල්-අර්ළ වලා යඌදුහු හිෆ්ලුහුමා වහුවල් අලියියුල් අලීම්."**

තේරුම- අල්ලාහ්, ඔහු හැර වෙනත් දෙවියෙක් නොමැත. සදා ජීවමාන ය, සදා පැවැත්මක් ඇත්තා ය. මඳ නින්ද හෝ (තද) නින්ද ඔහු ව ග්‍රහණය නො කරන්නේය. අහස් හි ඇති දෑ ද, මහපොළොවේ ඇති දෑ ද, ඔහු සතු ය. ඔහු අනුමැතිය දුන් අය මිස ඔහු අබියස මැදිහත්වන්නෙකු විය හැක්කේ කවරෙකුට ද? ඔවුනට ඉදිරියේ ඇති දෑ ද, ඔවුනට පසුපසින් ඇති දෑ ද, ඔහු දන්නේය. ඔහු අභිමත වූ පරිදි මිස ඔහුගේ දැනුමෙන් කිසිවක් ඔවුහු ග්‍රහණය නො කරති. ඔහුගේ ආසනය අහස් හි හා මහපොළොවෙහි ව්‍යාප්ත ව ඇත. ඒ දෙක ආරක්ෂා කිරීම ඔහුට දුෂ්කර නො වේ. තවද, ඔහු අතිඋත්තරීතර ය. සර්ව බලධාරී ය.[1]

එම පාරායනයන් අතරින් "**කුල් හුවල්ලාහු අහද්**" "**කුල් අඌදු බිරබ්බිල් ෆලක්**", "**කුල් අඌදු බිරබ්බින් නාස්**" යන සූරාවන් සෑම අනිවාර්යය සලාතයකින් පසුව පාරායනය කිරීම. එමෙන් ම ෆජ්ර් සලාතයෙන් පසු දහවල ආරම්භයේ ද, මග්රිබ් සලාතයෙන් පසු රාත්‍රිය ආරම්භයේ ද, නින්දට යන අවස්ථාවේ ද, තුන් වරක් බැගින් මෙම සූරාව පාරායනය කිරීම. එමෙන් ම රාත්‍රිය ආරම්භයේ සූරා බකරාවෙහි අවසන් පාඨ දෙක ද, පාරායනය කිරීම ද, ඒ අතරින් එකකි. අල්ලාහ්ගේ ප්‍රකාශය වන එම පාඨ දෙක මෙසේය. "**ආමනර් රසූලු බිමා උන්zසිල ඉලයිහි මින් රබ්බිහී**

[1]- සූරතුල් බකරා - 255

**වල් මුඃමිනූන් කුල්ලුන් ආමන බිල්ලාහි වමලාඉකතිහි වකුතුබිහි වරුසුලිහි ලා නුෆර්රිකු බයින අහදින් මින් රුසුලිහි වකාලූ සමිඃනා වඅතඃනා ගුෆ්රානක රබ්බනා වඉලයිකල් මසීර්"**

තේරුම: ධර්ම දූතයා තම පරමාධිපතිගෙන් තමන් වෙත පහළ කරනු ලැබූ දෑ පිළිබඳ ව විශ්වාස කළේය. විශ්වාස කළහු ද, (විශ්වාස කළෝය.) සියල්ලෝ ම අල්ලාහ්ව ද, ඔහුගේ ධර්ම ග්‍රන්ථ ද, ඔහුගේ ධර්ම දූතයින්ව ද, විශ්වාස කරති. ඔහුගේ රසූල්වරුන් අතරින් කිසිවෙකු අතර හෝ අපි වෙනස්කම් ඇති නො කරන්නෙමු. තවද, අපි සවන් දුනිමු. අවනත වූයෙමු. අපගේ පරමාධිපතියාණනි! ඔබෙන් සමාව පතන්නෙමු. තවද, යොමු වන ස්ථානය ඇත්තේ ඔබ වෙතය යැයි ඔවුහු පැවසුවෝය."

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්‍රකාශය කළ බවට තහවුරු වූ හදීසයක් මෙසේය. **"කවරෙකු රාත්‍රියෙහි ආයතුල් කුර්සී පාරායනය කළේ ද, ඔහු සමඟ අල්ලාහ්ගෙන් වූ ආරක්ෂයකු නිරන්තරයෙන් ම සිටින අතර ඔහු උදෑසන අවදි වන තෙක් ෂෙයිතාන් ඔහුට සමීප වන්නේ නැත."** එතුමාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්‍රකාශ කළ බවට තහවුරු වූ තවත් හදීසයක් මෙසේය. **"කවරෙකු රාත්‍රියේ සූරා අල් බකරාහි අවසාන ආයත් දෙක පාරායනය කළේ ද, ඒ දෙක ඔහුට ප්‍රමාණවත් වේ."**

එහි අර්ථය: අල්ලාහ් මැනවින් දන්නාය. සියලු ම නපුරුකම්වලින් ආරක්ෂා වන්නට ඒ දෙක ඔහුට ප්‍රමාණවත් වේ. රාත්‍රියේ හා දහවලේ මෙන් ම යම් ගොඩනැගිල්ලකට හෝ කාන්තාරයකට හෝ අහසට හෝ සාගරයට හෝ ගොඩ වැදුනේ නම් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා ප්‍රකාශ කළ පරිදි **"අඌදු බිකලිමාතිල්ලාහිත් තාම්මාති මින් ෂර්රි මා**

**කලක්"** (අල්ලාහ්ගේ පූර්ණ වදන් තුළින් ඔහු මැවූ සියලු දැහි හානියෙන් මම ආරක්ෂාව පතමි.) යන අනුවාදයෙන් ආරක්ෂාව අධිකව පැතීම ද, ඉන් එකකි. කවරෙකු යම් ස්ථානයකට ගොඩ වැදී; ඔහු **'අඌදු බිකලිමාතිල්ලාහිත් තාම්මාති මින් ෂර්රි මා කලක්'** (අල්ලාහ්ගේ පූර්ණ වදන් තුළින් ඔහු මැවූ සියලු දැහි හානියෙන් මම ආරක්ෂාව පතමි.) යනුවෙන් පවසන්නේ ද, ඔහු නැවත නිවස බලා යන තුරු ඔහුට කිසිදු හානියක් සිදු වන්නේ නැත. ඉන් තවත් ප්‍රාර්ථනාවක් වනුයේ මුස්ලිම්වරයා දහවල ආරම්භයේ මෙන් ම රාත්‍රිය ආරම්භයේ පහත සඳහන් පරිදි තුන් වරක් පැවසීමය. **"බිස්මිල්ලාහිල්ලදී ලා යළුර්රු මඅස්මිහි ෂෙයිඋන් ෆිල් අර්ලි වලා ෆිස්සමාඉ වහුවස් සමීඋල් අලීම්."** (අහස්හි සහ පොළොවේ ඇති කිසිවකට ඔහුගේ නාමය සමඟ හානියක් සිදු කළ නො හැකි අල්ලාහ්ගේ නාමයෙන් ආරක්ෂාව පතමි. ඔහු සර්ව ශ්‍රාවකය. සර්ව ඥානීය.)

මේ ගැන දිරිගැන්වීමේ වලංගු භාවය අල්ලාහ්ගේ දූතයාණන් විසින් වාර්තා කර ඇත. සැබැවින් ම එය සෑම උවදුරකින් ම ආරක්ෂා වන්නට හේතුවක් වේ. මෙම අනුවාද හා රැකවරණය ලබන ප්‍රාර්ථනා වනාහි, ඒවා සත්‍යයෙන් හා විශ්වාසයෙන් යුතුව අල්ලාහ් කෙරෙහි විශ්වාසය තබා ඔහු මත රැඳෙමින් කවර කරුණක් එය පෙන්වා දෙන්නේ ද, ඒ සඳහා හදවත විවෘත කරමින් ඒවා ආරක්ෂිතව පිළිපදින්නන්හට හූනියම හා අනෙකුත් උවදුරුවලින් ආරක්ෂා වීමෙහි බලවත් සාධක වන්නේය. එමෙන් ම හූනියම බලපෑමෙන් පසුව එය ඉවත් කිරීම සඳහා නිහතමානීව අල්ලාහ් වෙත අධික ලෙස යොමු වෙමින් ඔහුගෙන් පතමින් එම උවදුර ඉවත් කරන මෙන් ද, දුර්භාග්‍ය ඉවත් කරන මෙන් ද, ඉල්ලා සිටීමෙහි වඩාත් බලවත් ආයුධයක් වන්නේය.

හූනියම් හා වෙනත් රෝගාබාධවලට ප්‍රතිකාර කිරීමෙහි දී නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා පෙන්වා දුන් තහවුරු කරන ලද ප්‍රාර්ථනාවන් අතරින් සමහරක් ඇත. එතුමාණෝ තම සහගාමීන්හට ඒවා මඟින් ආරක්ෂාව සලසා දුන්හ. **“අල්ලාහුම්ම රබ්බන් නාසි අද්හිබිල් බඃස, වෂ්ෆි, අන්තෂ් - ෂාෆී ලා ෂිෆාඅ ඉල්ලා ෂිෆාඋක ෂිෆාඅන් ලා යුගාදිරු සකමා”**

(තේරුම: අහෝ මිනිසුන්ගේ පරමාධිපතියාණෙනි! දුක් කරදර පහ කරන්නාණෙනි! ඔබ සුවය දෙනු මැනව. සුවය දෙන්නා ඔබය. ඔබ හැර සුවය දෙන්නකු වෙනත් නැත. එය මනා සුවයකි. එය රෝගී ලෙස අතහැර නො දමයි.) මෙය තුන්වරක් පවසයි. ජිබ්රීල් (අලයිහිස් සලාම්) තුමා නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්හට රැකවරණය පැතූ ආරක්ෂිත ප්‍රාර්ථනා අතරින් තවත් ප්‍රාර්ථනාවක් වනුයේ:

**بِسْمِ اللهِ أَرْقِيكَ، مِنْ كُلِّ شَيْءٍ يُؤْذِيكَ، مِنْ شَرِّ كُلِّ نَفْسٍ أَوْ عَيْنِ حَاسِدٍ، اللهُ يَشْفِيكَ، بِسمِ اللهِ أُرقِيك**

**“බිස්මිල්ලාහි අර්කීක මින් කුල්ලි ෂෙය්ඉන් යුඃදීක මින් ෂර්රි කුල්ලි නෆ්සින් අව් අය්නි හාසිදින් අල්ලාහු යෂ්ෆීක බිස්මිල්ලාහි උර්කීක”**

(තේරුම: අල්ලාහ්ගේ නාමයෙනි, සෑම ආත්මයක ම නපුරින් හා ඊර්ෂ්‍යා කරන්නාගේ ඇස්වහින් ඔබට උවදුරු ඇති කරන සියලු දැයින් මම ඔබට ආරක්ෂාව පතමි. අල්ලාහ්ගේ නාමයෙනි, මම ඔබට ආරක්ෂාව පතමි.) මෙය නැවත නැවතත් තුන්වරක් පැවසිය යුතු වේ.

**හූනියම බලපෑවායින් පසු ඒ සඳහා ප්‍රතිකාර ක්‍රම අතරින් මිනිසාට සෙත සලසන තවත් ප්‍රතිකර්මයක් වනුයේ,** පුද්ගලයකු තම බිරිය සමඟ සංසර්ගයේ නියැළීමෙන් සීමා වූ විට අමු මසන් කොළ හතක් ගෙන එය ගලකින් හෝ වෙනත් යම් දෙයකින් කොටා එය භාජනයක දමා සේදීමට ප්‍රමාණවත් ජලය එහි වක් කොට එහි මෙම පාඨ පාරායනය කෙරේ. එනම්: "ආයතුල් කුර්සී", "කුල් යා අය්යුහල් කාෆිරූන්"(9), "කුල් හුවල්ලාහු අහ්ද්"(10), "කුල් අඌදු බිරබ්බිල් ෆලක්"(11), "කුල් අඌදු බිරබ්බින් නාස්"(12), සූරා අල් අඃරාෆ්හි සඳහන් හූනියම් හා සම්බන්ධ පාඨ. එනම් අල්ලාහ්ගේ ප්‍රකාශය වන:

**وَأَوْحَيْنَا إِلَى مُوسَى أَنْ أَلْقِ عَصَاكَ فَإِذَا هِيَ تَلْقَفُ مَا يَأْفِكُونَ ۝ فَوَقَعَ الْحَقُّ وَبَطَلَ مَا كَانُوا يَعْمَلُونَ ۝ فَغُلِبُوا هُنَالِكَ وَانْقَلَبُوا صَاغِرِينَ ۝ وَأُلْقِيَ السَّحَرَةُ سَاجِدِينَ ۝ قَالُوا آمَنَّا بِرَبِّ الْعَالَمِينَ ۝ رَبِّ مُوسَى وَهَارُونَ ۝**

**"වඅව්හයිනා ඉලා මූසා අන් අල්කි අසාක ෆඉදා හිය තල්කෆු මා යඃෆිකූන්. ෆවකඅල් හක්කු වබතල මා කානූ යඃමලූන්. ෆගලබූ හුනාලික වන්කලබූ සාගිරීන්."**

(තේරුම: තවද, 'නුඹ නුඹේ සැරයටිය දමනු' යැයි අපි මූසා වෙත දන්වා සිටියෙමු. එවිට එය ඔවුන් සිදු කළ විජ්ජාවන් ගිල දැමීය. එවිට සත්‍ය ස්ථාපිත විය. තවද, ඔවුන් සිදු කරමින් සිටි දෑ නිෂ්ඵල විය. එවිට එහි ඔවුන් පරාජයට පත් කරන ලදී. තවද, ඔවුහු පහත් වූවන් ලෙස පත් වූවෝය.)

සූරා යූනුස්හි පාඨය:

**فَلَمَّا جَاءَ السَّحَرَةُ قَالَ لَهُمْ مُوسَىٰ أَلْقُوا مَا أَنْتُمْ مُلْقُونَ 80 فَلَمَّا أَلْقَوْا قَالَ مُوسَىٰ مَا جِئْتُمْ بِهِ السِّحْرُ ۖ إِنَّ اللَّهَ سَيُبْطِلُهُ ۖ إِنَّ اللَّهَ لَا يُصْلِحُ عَمَلَ الْمُفْسِدِينَ 81 وَيُحِقُّ اللَّهُ الْحَقَّ بِكَلِمَاتِهِ وَلَوْ كَرِهَ الْمُجْرِمُونَ 82**

“වකාල ෆිර්අවුන උ‍ඃතූනී බිකුල්ලි සාහිරින් අලීම්, ෆලම්මා ජාඅස් සහරතු කාල ලහුම් මූසා අල්කූ මා අන්තුම් මුල්කූන්. ෆලම්මා අල්කව් කාල මූසා මා ජිඃතුම් බිහිස් සිහ්රු ඉන්නල්ලාහ සයුබ්තිලුහූ, ඉන්නල්ලාහ ලා යුස්ලිහු අමලල් මුෆ්සිදීන්. වයුහික්කුල්ලාහුල් හක්ක බිකලිමාතිහීවලව් කරිහල් මුජ්රිමූන්.”

(තේරුම: තවද, ‘මනා දැනුම ඇති සෑම හූනියම්කරුවකුම මා වෙත නුඹලා ගෙන එනු’යි ෆිර්අවුන් පැවසුවේය. හූනියම්කරුවෝ පැමිණි කල්හි ‘නුඹලා හෙළන්නට සිටින දෑ නුඹලා හෙළනු’ යැයි මූසා ඔවුනට කීවේය. ඔවුන් හෙළූ කල්හි ‘නුඹලා කවර දෙයක් ගෙන ආවද එය හූනියමකි. නියත වශයෙන් ම අල්ලාහ් එය නිෂ්ඵල කරනු ඇත. නියත වශයෙන් ම අල්ලාහ් කලහකාරීන්ගේ ක්‍රියාව විධිමත් නො කරනු ඇත’ යැයි මූසා පැවසුවේය. වැරදිකරුවෝ පිළිකුල් කළ ද, අල්ලාහ් ඔහුගේ ප්‍රකාශයන් මඟින් සත්‍ය සනාථ කරනු ඇත.)

සූරා තාහා හි පාඨ:

**قَالُوا يَا مُوسَىٰ إِمَّا أَنْ تُلْقِيَ وَإِمَّا أَنْ نَكُونَ أَوَّلَ مَنْ أَلْقَىٰ 65 قَالَ بَلْ أَلْقُوا ۖ فَإِذَا حِبَالُهُمْ وَعِصِيُّهُمْ يُخَيَّلُ إِلَيْهِ مِنْ سِحْرِهِمْ أَنَّهَا تَسْعَىٰ 66 فَأَوْجَسَ فِي نَفْسِهِ خِيفَةً مُوسَىٰ 67 قُلْنَا لَا تَخَفْ إِنَّكَ أَنْتَ الْأَعْلَىٰ 68 وَأَلْقِ مَا فِي يَمِينِكَ تَلْقَفْ مَا صَنَعُوا ۖ إِنَّمَا صَنَعُوا كَيْدُ سَاحِرٍ ۖ وَلَا يُفْلِحُ السَّاحِرُ حَيْثُ أَتَىٰ 69**

(තේරුම: අහෝ! මූසා, එක්කො නුඹ (මුලින් ම) හෙළිය යුතුය. එසේ නැතහොත් හෙළන්නන්ගෙන් මුල් අය අප වන්න දැයි ඔවුහු පැවසුවෝය.'එසේ නම් නුඹලා හෙළනු' යැයි ඔහු පැවසුවේය. එවිට ඔවුන්ගේ ලණු හා ඔවුන්ගේ සැරයටි විය. ඔවුන්ගේ හූනියම හේතුවෙන් ඒවා ගමන් කරන මෙන් දිස් විය. එවිට මූසාට, ඔහුගේ සිත තුළ බිය හැඟීමක් එය ඇති කළේය.නුඹ බිය නො වනු. නියත වශයෙන් ම උසස් වනුයේ නුඹ ම යැයි අපි පැවසුවෙමු. නුඹේ දකුණතෙහි ඇති දෑ නුඹ හෙළනු. ඔවුන් සිදු කළ දෑ එය ගිල දමනු ඇත. එසේ ඔවුන් සිදු කළේ හූනියම්කරුවකුගේ කුමන්ත්‍රණයයි. හූනියම්කරුවා කවර අයුරින් පැමිණිය ද, ජය නො ලබනු ඇත.)(15)

ජලය තුළ සඳහන් කරනු ලැබූ පාරායනයන් පාරායනය කිරීමෙන් පසුව ඉන් උගුරු තුනක් පානය කොට ඉතිරියෙන් ස්නානය කර ගනී. එමඟින් අල්ලාහ් අභිමත කළේ නම් රෝගය ඉවත්ව යනු ඇත. එය දෙවතාවක් හෝ ඊට වැඩි වතාවක් උපයෝගී කිරීමට අවශ්‍ය වූයේ නම් රෝගය ඉවත් වන තුරු එසේ සිදු කිරීමෙහි වරදක් නැත.

හූනියම් සඳහා වූ ප්‍රතිකාර අතරින් තවත් කරුණක් වන්නේ (එය ඉතා ප්‍රයෝජනවත් ප්‍රතිකර්මයකි) භූමියක හෝ කන්දක හෝ වෙනත් තැනක හෝ සිදු කර ඇති හූනියම් ස්ථානය සොයා ගැනීමය. එසේ හඳුනා ගත් විටෙක එය එළියට ගෙන හූනියම නිශ්ඵල වන අයුරින් විනාශ කර දැමිය යුතුය. මේවා; හූනියමෙන් ආරක්ෂා වීම හා ඒ සඳහා වූ ප්‍රතිකාර පිළිබඳ කරුණු පැහැදිලිව සඳහන් කිරීමට හැකි වූ කරුණු කිහිපයකි. ආශිර්වාද කිරීමේ භාරකරු අල්ලාහ්ය.
ජින්වරුන් වෙත සත්ව කැපයක් පිළිගැන්වීම හෝ ඒ හැර වෙනත් යම් ආකාරයකින් සමීපතාව ලැබීම යනාදී හූනියම් කටයුත්තක් ඔස්සේ ප්‍රතිකාර කිරීම සුදුසු නො වන්නේය.

සැබැවින් ම එය ෂෙයිතාන්ගේ ක්‍රියාවක් පමණක් නො ව මහා ෂිර්ක් අතරින් එකක් වන්නේය. එයින් වැළකී සිටීම අනිවාර්යය වන්නේය. එමෙන් ම හූනියම් කරුවන්, ජෝතිෂ්‍ය වේදීන් හා සාස්තරකරුවන්ගෙන් විමසා ප්‍රතිකාර කිරීම ඔවුන් පවසන දෑ අනුව කටයුතු කිරීම සුදුසු නො වන්නේය. හේතුව සැබැවින් ම ඔවුන් දේවත්වය විශ්වාස නොකරන්නෝ වෙති. එමෙන් ම ඔවුන් ගුප්ත දෑ පිළිබඳ වාද කරමින් ජනයා අන්දන දුෂ්ඨ බොරුකාරියෝ වෙති.

සැබැවින් ම දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා ඔවුන් වෙත යාමත් ඔවුන්ගෙන් කරුණු විමසා සිටීමත් ඔවුන් සත්‍ය බව පවසා සිටීමත් වැළැක්වීය.ඒ ගැන මෙම ලිපිය ආරම්භයේ පැහැදිලි කර ඇත. අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්‍රකාශය කළ බවට තහවුරු වූ හදීසයක් මෙසේය. සැබැවින් ම එතුමාගෙන් හූනියම් කැපීම සම්බන්ධයෙන් විමසන ලදී. එවිට එතුමා: **"එය ෂෙයිතාන්ගේ**

**ක්‍රියාවෙන් වූවකි."** යැයි පැවසූහ. මෙය අහ්මද් හා අබූ දාවූද් යන ඉමාම්වරු විසින් මනා වාර්තා සම්බන්ධතාවකින් යුතුව වාර්තා කර ඇත.

හූනියම් කැපීම යනු හූනියම් කරනු ලබන්නාගෙන් හූනියම ඉවත් කිරීමය. (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා එතුමාගේ මෙම ප්‍රකාශයෙන් අදහස් කළේ අඥාන සමයේ පරිහරනය කළ හූනියම් කැපීමේ ක්‍රියාවලියයි. එය හූනියම් කරුගෙන් හූනියම කපන මෙන් ඉල්ලා සිටීම හෝ එවැනිම හූනියමක් තුළින් හූනියම කපන මෙන් වෙනත් හූනියම්කරුවකුගෙන් ඉල්ලා සිටීමයි.

ඉහත සඳහන් කළ පරිදි ආගමානුගත කරන ලද රැකවරණයන් හා ආරක්ෂිත ක්‍රම මෙන් ම අනුමත කරන ලද ඖෂධ තුළින් එය ඉවත් කිරීමෙහි කිසිදු වරදක් නැත. ආචාර්යය ඉබ්නු කය්යිම් හා අෂ්-ෂෙයික් අබ්දුර් රහ්මාන් බින් හසන් යන උතුමන්ලා "ෆත්හුල් මජීද්" නම් කෘතියෙහි මේ ගැන සඳහන් කර ඇති අතර වෙනත් අය විසින් ද, මේ ගැන සඳහන් කර ඇත.

සියලු උවදුරුවලින් සුවය ලබන්නට මුස්ලිම් ප්‍රජාවට අල්ලාහ් ආශිර්වාද කරන මෙන් ද, ඔවුනට ඔවුන්ගේ දහම ආරක්ෂා කර දෙන මෙන් ද, එහි නිසි අවබෝධය ඔවුනට පෝෂණය කරන මෙන් ද, දහමට පටහැනි සියලු දැයින් ආරෝග්‍යමත්භාවය ලබා දෙන මෙන් ද, අල්ලාහ්ගෙන් පතමු. ඔහුගේ ගැත්තා වන ඔහුගේ ධර්ම දූතයාණන් වන මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් කෙරෙහි ශාන්තිය හා සමාදානය උදාවේවා!

# බිරිය සැමියාට එරෙහිව හූනියම් කිරීම.....

අබ්දුල් අසීස් ඉබ්නු බාස්තුමා විසින් ගරු සහෝදර... තුමා වෙත. අස්සලාමු අලයිකුම් වරහ්මතුල්ලාහි වබරකාතුහු.....

ඔබගේ දින (නොමැ)ති ලිපිය මට ලැබී ඇත. අල්ලාහ් ඔබට මග පෙන්වනු ඇත. ඔබට ඔබේ නව බිරිඳ සමඟ සංසර්ගයේ යෙදීමට අවශ්‍ය වූ විට ඔබට අත් වූ ඉරණම, ඔබ ෂෙයික්වරයා වෙත ගොස් ඔහු ඔබට දුන් තීන්දුව සහ ඔබේ නව බිරිඳ සමඟ සංසර්ගයේ යෙදීමෙන් ඔබව වළක්වා ගැනීමට හේතුවක් වූ ඔබේ මුල් බිරිය කටයුතු කළ ආකාරය යනාදී කරුණු එහි සඳහන් වී තිබුණි. මේවා සම්බන්ධයෙන් වූ නීති පිළිබඳ ඔබ විමසා සිටි ඔබේ ප්‍රශ්නය ප්‍රකට කරුණකි.

**පිළිතුර:** මෙම ක්‍රියාව මුල් බිරිය විසින් පිළිගෙන ඇත්තේ නම් හෝ පැහැදිළිව ඇය ඒ මත ස්ථාවරව සිටියේ නම් හෝ ඇය සිදු කර ඇත්තේ බරපතල වරදකි. එය දේවත්වය ප්‍රතික්ෂේප කිරීමක් මෙන් ම මුලාවකි. ඊට හේතුව සැබැවින් ම ඇය එසේ සිදු කර ඇත්තේ තහනම් කරන ලද හූනියමයි. උත්තරීතර අල්ලාහ් පවසන පරිදි හූනියම් කරන්නා දේවත්වය ප්‍රතික්ෂේප කළ අයෙකි. සුලෙයිමාන්ගේ පාලන සමයේ ෂෙයිතානුන් පාරායනා කළ දෑ ඔවුහු අනුගමනය කළහ. සුලෙයිමාන් ප්‍රතික්ෂේප නො කළේ ය. නමුත් ෂෙයිතානුන් ප්‍රතික්ෂේප කළෝය. ඔවුහු ජනයා ට හූනියම ද, බැබිලෝනියාවේ හාරූත් මාරූත් යන මලක් වරුන් දෙදෙනා ට පහළ කරනු ලැබූ දෑ ද, ජනයා ට ඉගැන් වූවෝය. නමුත් ඔවුන් දෙදෙනා සැබැවින් ම **"අපි පරීක්ෂණයකි. එබැවින් නුඹ**

**ප්‍රතික්ෂේප නොකරනු”යි පවසා සිටීමෙන් මිස කිසිවෙකු ට ඉගැන්නුවේ නැත. එවිට ඔවුන් දෙදෙනාගෙන් සැමියා හා තම බිරිය අතර වෙන් කරවන දෑ ඉගෙන ගත්තෝය. අල්ලාහ්ගේ අනුබලයෙන් මිස කිසිවෙකු ට කිසි වකින් හානි පමුණුවන්නන් ලෙස ඔවුන් නැත. තව ද, ඔවුන ට හානි පමුණුවන ප්‍රයෝජනවත් නො වන කරුණු ද ඉගෙන ගනිති. තවද, සැබැවින් ම එය මිල ට ගත් අය ට පර ලොවෙ හි කිසිදු කොටසක් නොමැති බව සැබැවින් ම ඔවුහු දැන සිටියෝය. ඔවුන් විකුණා මිල දී ගත් දෑ නපුරු විය. ඔවුන් (මේ ගැන) දැන සිටියේ නම්.**

මෙම පාඨය සැබැවින් ම හූනියම දේවත්වය ප්‍රතික්ෂේප කිරීමක් බවත් හූනියම් කරන්නා දේවත්වය ප්‍රතික්ෂේප කරන්නෙකු බවත් පෙන්වා දෙයි. සැබැවින් ම හූනියම්කරුවෝ ඔවුනට ප්‍රයෝජනවත් නො වන හානි පමුණුවන දෑ ඉගෙන ගනිති. ඔවුන්ගේ අරමුණු අතරින් ස්වාමි පුරුෂයා හා ඔහුගේ බිරිය වෙන් කිරීම ද එකකි. මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ සැබැවින් ම ඔවුනට කිසිදු කොටසක් නැත. (එනම් සාර්තකත්වයේ කිසිදු කොටසක් ඔවුනට හිමි නැත යන්නයි.) සහීහ් හදීසයන්ගෙන් අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්‍රකාශ කළ හදීසයක් මෙසේ සඳහන් වේ. **“විනාශ කර දමනු ලබන කරුණු හතකින් නුඹලා වළකිනු” “අහෝ අල්ලාහ්ගේ දූතයාණනි! ඒවා කුමක්දැ?”යි විමසනු ලැබීය. එතුමා මෙසේ පැවසූහ. “අල්ලාහ්ට යමක් හවුල් කර ආදේශ කිරීම, හූනියම, කිසිදු සාධාරණ හේතුවකින් තොර ව මිනිස් ජීවිතයක් ඝාතනය කිරීම, පොලිය අනුභව කිරීම, අනාථ දරුවන්ගේ මුදල් හා දේපළ අනුභව කිරීම, දරුණු යුදමය තත්වයක දී පැන දිවීම, දේවත්වය විශ්වාස කළ සැදැහැවත් නිර්මළ කාන්තාවන්ට අවලාද නැගීම වේ.”**

ඔබට ප්‍රතිකාර කළ එම ෂෙයික්වරයා මතු පිටින් පෙනෙන්නේ ඔහු කාන්තාවක් බඳු හූනියම් කරුවකු ලෙසයි. සැබැවින් ම හූනියම් හා සම්බන්ධ කටයුතු හූනියම් කරුවන් මිස වෙනත් කිසිවකු එඹී නො බලන බැවිණි. එමෙන් ම ඔහු බොහෝ කටයුතුවල දී ගුප්ත දෑ පිළිබඳ වාද කිරීමෙන් ප්‍රසිද්ධියට පත් ජේන කියන්නන් හා සාස්තර කරුවන්ගෙන් කෙනෙකි. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ ප්‍රකාශයට අනුව ඔවුන්ගෙන් වැළකී සිටීමත් ගුප්ත දෑ පිළිබඳ ඔවුන් තර්ක කරමින් සිටින විෂයයෙහි ඔවුන් සත්‍යවාදීන් බවට සහතික නො කර සිටීමත් මුස්ලිම්වරයකුට අනිවාර්යය වන්නේය.

**“කවරෙකු හෝ සාස්තර කාරයෙකු වෙත පැමිණ ඔහුගෙන් යමක් විමසා සිටියේ ද, ඔහුගේ රාත්‍රී හතළිහක සලාතයන් පිළිගනු නො ලබන්නේමය.”** මෙය ඉමාම් මුස්ලිම් විසින් ඔහුගේ සහීහ් ග්‍රන්ථයේ වාර්තා කර ඇත. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ තවදුරටත් මෙසේ පැවසූහ. **“කවරෙකු සාස්තර කාරයකු වෙත හෝ ජෝතිෂ්‍ය වේදියෙකු වෙත පැමිණ ඔහු පවසන දෑ සත්‍යක් බව තහවුරු කර සිටියේ ද, සැබැවින් ම ඔහු මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා වෙත පහළ කළ දෑ ප්‍රතික්ෂේප කළේය.”**

ඔබෙන් සිදු වූ වරද වෙනුවෙන් පාපක්ෂමාවෙහි නිරත වීමත් පශ්චාත්තාප වීමත් නීතිපතිවරයා හා අධිකරණ ප්‍රධානියා වෙත මෙම ෂෙයික්වරයා ගැන හා ඔබේ මුල් බිරිය ගැන පැමිණිලි කර සිටීමත් ඔබට අනිවාර්යය වන්නේය. එවිට උසාවිය හා නීති කොමිසම ඔවුන්ව වළක්වාලන ක්‍රියාමාර්ග ගනු ඇත. එමෙන් ම මෙවැනි සිදුවීමක් ඔබට සිදු වූයේ නම්, ඔබට නිත්‍යානුකූල ප්‍රතිකාර ක්‍රම දන්වා සිටින ආගමික

විද්වතුන්ගෙන් විමසා දැන ගන්න. අල්ලාහ් අපටත් ඔබටත් දහම පිළිබඳ අවබෝධයත් ඒ මත වන ස්ථාවරත්වයත් එයට පටහැනිව කටයුතු කිරීමෙන් ආරක්ෂාවත් දායාද කරනු මැනව. සැබැවින් ම ඔහු මහත් ගෞරවාන්විත ත්‍යාගශීලීය.

ඔබට ශාන්තිය ද, අල්ලාහ්ගේ කරුණාව ද, ඔහුගේ අභිවෘද්ධිය ද, ලැබේවා!

# මන්ත්‍ර ගුරුකම් කරන්නන් හා භූනියම් කරුවන්ගෙන් විමසා සිටීම පිළිබඳ නීතිය.

**ප්‍රශ්නය:** රියාද් හි වෙසෙන සහෝදරයෙකු ඔහුගේ ප්‍රශ්නයේ දී මෙසේ විමසා සිටියේය. යමනයේ ඇතැම් ප්‍රදේශවල 'අස්-සාදා' (බාවාවරු) යන නමින් මිනිස් කොට්ඨාශයක් දක්නට ලැබේ. මොවුහු මන්ත්‍ර ගුරුකම් හා දහමෙහි නොමැති දෑ සිදුකරමින් සිටිති. සුව කළ නොහැකි රෝග ජනයාට සුව කිරීමේ ශක්තිය ඔවුනට ඇතැයි වාද කරති. ඒ සඳහා කිනිසිවලින් ඔවුහු ඇනගනිමින් ඔවුන්ගේ දිවවල් කපා ගනිමින් ඔප්පු කරන්නට බලති. පසුව ඒවා කිසිදු හානියකින් තොරව ඔවුන් වෙත නැවත සේන්දු වේ. ඔවුන් අතර සලාත් ඉටු කරන්නෝ මෙන් ම සලාත් ඉටු නොකරන්නෝ ද, වෙති. එමෙන් ම ඔවුන්ගේ පාර්ශවයට අයත් නොමැති කාන්තාවන් ඔවුන් විවාහ කර ගැනීම ඔවුනට අනුමත කාර්යයක් වන බවත් ඔවුන්ගේ පාර්ශවයෙන් කිසිවෙකු වෙනත් කිසිදු පාර්ශවයකට විවාහ කර දීම අනුමත කාර්යයක් නො වන බවත් පවසති. රෝගීන් සඳහා ඔවුන්ගේ ප්‍රාර්ථනාවෙහි ඔවුන් "අහෝ අල්ලාහ් අහෝ තැනැත්තා" යනුවෙන් ඔවුන්ගේ මුතුන් මිත්තන්ගෙන් කෙනකුව ද, ආමන්ත්‍රණය කරමින් ප්‍රාර්ථනා කරති. පෙර කාලයේ ජනයා ඔවුන්ව විශාල කොට සැලකුවෝය. ඔවුන් අසාමාන්‍ය මිනිස් කොට්ඨාශයක් ලෙසත් ඔවුන් අල්ලාහ්ට සමීප වූවන් ලෙසත් සැලකුවෝය. "අල්ලාහ්ගේ සමීපතයින්" යැයි ඔවුන් හඳුන්වනු ලැබුවෝය. වර්තමානයේ ඔවුන් අතර ජනයා බෙදී සිටිති. ඔවුන් අතර ඔවුනට විරුද්ධව කටයුතු කරන අය ද, සිටිති. එය තරුණ කණ්ඩායම් මෙන් ම ඇතැම් ගුරුවරු පිරිසකි. එමෙන් ම තවමත් ඔවුන් ව පිළිපදිමින් සිටින

අය ද වෙති. ඔවුන් වයසින් වැඩි, දැනුම නොමැති පිරිසකි. මෙම මාතෘකාවේ යථාර්ථය පැහැදිලි කරන මෙන් ගරු කටයුතු ඔබතුමාගෙන් අපි ඉල්ලා සිටින්නෙමු.

**පිළිතුර**: මොවුන් හා මොවුනට සමාන වූවන් පිළිකුල් සහගත ක්‍රියා හා ව්‍යාජ හැසිරීම් ඇති සූෆිවරුන්ගේ කණ්ඩායමට අයත් උදවියයි. එමෙන් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් පවසා සිටි පරිදි අනාවැකි පළ කරන්නනන්ගේ කණ්ඩායමට අයත් උදවියයි. "**කවරෙකු හෝ අනාවැකි පවසන සාස්තර කාරයෙකු වෙත පැමිණ ඔහුගෙන් යමක් විමසා සිටියේ ද, ඔහුගේ දින හතළිහක සලාතයන් පිළිගනු නො ලබන්නේ මය.**" එය ඔවුන් ගුප්ත දෑ පිළිබඳ දැනුම ඇත්තන් බව වාද කිරීම, ඔවුන් ජින්වරුන්ට සේවය සැපයීම, ඔවුනට නැමදුම් කිරීම හා හූනියම් කටයුතු කරමින් ජනයා ඇන්දවීම වැනි කටයුතු හේතුවෙනි.

ඒ ගැන මූසා හා ෆිර්අවුන්ගේ කතාව තුළ අල්ලාහ් මෙසේ පවසා සිටියි. ඔවුහු එය දැමූ කල්හි මිනිසුන්ගේ ඇස් බැන්දුම් විය. ඔවුහු ඔවුන් බියගන්වන්නට බැලුවෝය. ඔවුහු ඉමහත් මායාවක් ගෙන ආවෝය. මෙම ශුද්ධ වූ හදීසය අනුව ඔවුන් වෙත යාමත් ඔවුන්ගෙන් කරුණු විමසා සිටීමත් සුදුසු නො වීය. (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ ප්‍රකාශය මෙසේය. "**කවරෙකු සාස්තර කාරයකු ජෝතිෂ්‍ය වේදියෙකු වෙත පැමිණ ඔහු පවසන දෑ සත්‍යක් බව තහවුරු කර සිටියේ ද, සැබැවින් ම ඔහු මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා වෙත පහළ කළ දෑ ප්‍රතික්ෂේප කළේය.**" තවත් ප්‍රකාශයක: "**කවරෙකු සාස්තරකාරයකු වෙත හෝ පලාපල කියන්නෙකු වෙත පැමිණ ඔහු පවසන දෑ සත්‍යක් බව තහවුරු කර සිටියේ ද, සැබැවින් ම ඔහු මුහම්මද්**

**(සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා වෙත පහළ කළ දෑ ප්‍රතික්ෂේප කළේය."**

අල්ලාහ් නො වන අයගෙන් ඔවුන් ප්‍රාර්ථනා කිරීම, අල්ලාහ් නො වන අයගෙන් උදව් පැතීම හෝ සැබැවින් ම ඔවුන්ගේ මුතුන් මිත්තන් හා ඔවුන්ගේ පැරැණ්නන් ලොවෙහි කටයුතු සිදු කරති; රෝගීන් සුව කරති; යැයි ඔවුන් විශ්වාස කිරීම හෝ ඔවුන්ගේ මරණයත් සමඟ හෝ ඔවුන් රහත් වීමෙන් පසු ප්‍රාර්ථනාවට පිළිතුරු දෙනු ලබන බව විශ්වාස කිරීම යනාදී මේ සියල්ල අල්ලාහ්ව ප්‍රතික්ෂේප කිරීමකි. එමෙන් ම මහා ෂිර්ක් ගණයට අයත් වේ. ඔවුන් හෙළා දැකීම, ඔවුන් වෙත යාමෙන් වැළකී සිටීම, ඔවුන්ගෙන් කරුණු විමසා නොසිටීම, ඔවුන් සත්‍ය බව තහවුරු නො කිරීම යනාදිය අනිවාර්යය වන්නේය. සැබැවින් ම ඔවුන් මෙම ක්‍රියාවන්හි හූනියම් කරුවන් හා අනාවැකි කියන්නන්ගේ ක්‍රියාවන් අතර හා අල්ලාහ් නො වන ගැත්තන් හට ආදේශ කරන්නන් අල්ලාහ් නොවන්නන්ගෙන් උදව් පතන්නන් හා අල්ලාහ් නො වන ජින්වරුන් මිය ගිය ඇත්තන් හා ඔවුනට පක්ෂපාතී අය අතරින් වෙනත් අයගෙන් උපකාර පතන්නන්ගේ ක්‍රියාවන් අතර මුසු කරති. සැබැවින් ම ඔවුන්ගේ මුතුන් මිත්තන් හා ඔවුන්ගේ පැරැණ්නන් හෝ වෙනත් ජනයාට භාරකාරත්වය ඇති බවත් ඔවුනට ප්‍රාතිහාර්යයන් ඇති බවත් විශ්වාස කරති. මේ සියලු කටයුතු පිවිතුරු දහම හෙළා දකින මන්ත්‍ර ගුරුකම් හා සාස්තර කරුවන් මෙන් ම අනාවැකි කියන්නන්ගේ ක්‍රියාවන් අතරින් වන්නේය.

කිනිස්සෙන් තමන්ට ඇණ ගැනීම තමන්ගේ දිව කපා ගැනීම වැනි පිළිකුල් සහගත ක්‍රියාවන් සියල්ල මිනිසා බන්ධනයට පත් කරන දෑය.

මේ සියල්ල ඉහත කී පරිදි තහනම් කරමින් හා වළක්වමින් අල් කුර්ආනයේ හා සුන්නාවේ සඳහන් ව පැමිණ ඇති තහනම් කරනු ලැබූ හූනියම් වර්ග අතරට අයත්ය. එමඟින් බුද්ධිමතා මුළාවට පත් නො විය යුතුය. මෙය ෆිර්අවුන්ගේ මායාකරුවන් පිළිබඳ උත්තරීතර සුවිශුද්ධ අල්ලාහ් පවසා සිටි වර්ගයට අයත් වේ. **"ඔවුන්ගේ හූනියම හේතුවෙන් ඒවා ගමන් කරන මෙන් දිස් විය."** මොවුහු හූනියම මෙන් ම මන්ත්‍රගුරුකම්, සාස්තර කීම්, අනාවැකි කීම් යානාදී කරුණු මෙන් ම මහා ශිර්ක්, අල්ලාහ් නොවන්නන්ගෙන් උදව් පැතීම්, අල්ලාහ් නොවන්නන්ගෙන් උපකාර පැතීම යනාදී කරුණු හා ගුප්ත දෑ ගැන තර්ක කිරීම, විශ්ව දැනුමෙහි කටයුතු කිරීම යනාදී කරුණු අතර සියල්ල එකට ගොනු කර ගත්තෝය. මේ වර්ගයේ බොහෝමයක් දෑ මහා ෂිර්ක් හා පැහැදිලි දේව ප්‍රතික්ෂේපයේ වර්ග අතරට අයත්ය. එමෙන් ම අල්ලාහ් තහනම් කළ මන්ත්‍රකරුවන්ගේ ක්‍රියාවන් හා අල්ලාහ් හැර වෙනත් කිසිවකුට දැනගත නොහැකි ගුප්ත දෑ පිළිබඳ වාද කරන්නන්ගේ ක්‍රියාවන් අතරට අයත්ය. "(නබිවරය!) නුඹ පවසනු. අල්ලාහ් හැර අහස්හි හා මහපොළොවේ සිටින්නන් ගුප්ත දෑ පිළිබඳ නො දනිති." (21) ඔවුන් හෙළා දැකීම, ඔවුන්ගේ කටයුතුවල නපුරුකම හා ඒවා පිළිකුල් සහගත බව පැහැදිලි කිරීම හා ඔවුන්ගේ විෂය කටයුතු භාර උදවිය වෙත පැමිණිලි කිරීම යනාදිය ඔවුන්ගේ තත්වය හඳුනන සියලු මුස්ලිම්වරුන්හට අනිවාර්යය වන්නේය. මෙවැන්නන් ඉස්ලාමීය රටක සිටින්නේ නම් වැදගත් වන්නේ, ඔවුන්ගේ නපුරට තිත තැබීමට සහ ඔවුන්ගේ අසත්‍ය සහ රැවටිලිවලින් මුස්ලිම්වරුන් ආරක්ෂා කර ගැනීමට ෂරියා ප්‍රකාරව ඔවුන්ට ලැබිය යුතු දඬුවම් ලබා දීමය.

අල්ලාහ් ආශිර්වාදයේ භාරකරුය.

# ජින්වරුන් (අග්නි භූතයින්) යොදා ගන්නා ජන වෛද්‍යවරයකු ළඟ ප්‍රතිකාර කිරීම

**ප්‍රශ්නය:** මෙහි ඔවුන්ගේ වචනයට අනුව ජන වෙදකම මඟින් ප්‍රතිකාර කරන පිරිසක් මිනිසුන් අතර සිටිති. ඔවුන්ගෙන් කිසිවකු වෙත හෝ මා ගිය විට ඔහු මට: ඔබේ නම හා ඔබේ මවගේ නම ලියා හෙට දින අප වෙත එන්නැ'යි පවසා සිටියි. එසේ පුද්ගලයෙක් ඔවුන් වෙත පැමිණි අවස්ථාවේ ඔවුහු ඔහුට "ඔබට මේ මේ අපල තිබේ. ඒ සඳහා මේ මේ ප්‍රතිකාර කළ යුතුව ඇත" යැයි පවසති. ඔවුන්ගෙන් කෙනෙකු "සැබැවින් ම ඔහු ප්‍රතිකර්ම කිරීමේ දී අල්ලාහ්ගේ කුර්ආනය භාවිත කරනු ඇතැ"යි පවසයි. මෙවැන්නන් ගැන ඔබේ අදහස කුමක් ද? ඔවුන් වෙත යෑම සම්බන්ධයෙන් වූ නීතිය කුමක් ද?

**පිළිතුර:** කවරෙකු ප්‍රතිකර්ම කිරීමේ දී මෙවන් කටයුත්තක් සිදු කරන්නේ ද, සැබැවින් ම ඔහු ජින්වරුන් භාවිත කරන බවට හා ගුප්ත දෑ පිළිබඳ වාද කරන බවට වූ සාධකයකි. එවැන්නෙකු වෙත යෑම හෝ ඔහුගෙන් විමසා සිටීම හෝ සුදුසු නොවන්නාක් මෙන් ම ඔහු ළඟ ප්‍රතිකාර ගැනීම ද, සුදුසු නො වන්නේය. මෙම වර්ගයේ මිනිසුන් පිළිබඳ නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා පහත අයුරින් ප්‍රකාශ කර ඇති හෙයිනි. "**කවරෙකු හෝ සාස්තර කාරයෙකු වෙත පැමිණ ඔහුගෙන් යමක් විමසා සිටියේ ද, ඔහුගේ රාත්‍රී හතළිහක සලාතය පිළිගනු නො ලබන්නේ මය.**" මුස්ලිම්තුමා සිය සහීහ් ග්‍රන්ථයේ මෙය වාර්තා කර ඇත. සාස්තර කරුවන්, අනාවැකි කියන්නන් හා හූනියම් කරුවන් වෙත යෑම තහනම් බවත් ඔවුන්ගෙන් විමසා සිටීම හා ඔවුන් කරන දෑ සත්‍ය බව

පවසා සිටීම තහනම් බවත් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් විසින් ස්ථිර ලෙස පවසා සිටි බොහෝ හදීස්වල සඳහන්ව ඇත. සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණෝ මෙසේ පවසා සිටියහ. **“කවරෙක් සාස්තර කරුවකු වෙත පැමිණ ඔහු පවසන දෑ සත්‍යක් බව තහවුරු කර සිටියේ ද, සැබැවින් ම ඔහු මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා වෙත පහළ කළ දෑ ප්‍රතික්ෂේප කළේය.”**

ගල් කැට හෝ බෙල්ලන් විසි කිරීම, මහපොළොවේ ඉරි ඇඳීම හෝ රෝගියාගෙන් ඔහුගේ නම ඔහුගේ මවගේ නම ඔහුගේ සමීප ඥාතීන්ගේ නම් විමසා සිටීම වැනි කාර්යයන් යොදා ගනිමින් ගුප්ත දැනුම පිළිබඳ වාද කරන සෑම කෙනෙකු ම සාස්තර හා අනාවැකි කියන්නන් හා හූනියම් කරුවන් අතරින් කෙනෙකු බව පෙන්වා දෙයි. එවැන්නන්ගෙන් කරුණු විමසා සිටීම හා ඔවුන් ව තහවුරු කර සිටීම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ තහනම් කළහ.

ඔවුන් අල් කුර්ආනය මඟින් සුව කරන බවට විශ්වාස කර සිටිය ද, ඔවුන්ගෙන් වැළකී සිටීමත් ඔවුන්ගෙන් කරුණු විමසා සිටීමෙන් හා ඔවුන්ගෙන් ප්‍රතිකාර කිරීමෙන් වැළකී සිටීමත් අනිවාර්යය වන්නේය. ඊට හේතුව අසත්‍ය වාදීන්ගේ සිරිත ජනයා ඇන්ඳවීම හා ඔවුනට වංචා කිරීම වන බැවිණි. එහෙයින් ඔවුන් පවසන දෑහි ඔවුන් සත්‍යවාදීන් බව තහවුරු කර සිටීම සුදුසු වන්නේ නැත. එමෙන් ම ඔවුන්ගෙන් කිසිවකු ගැන යමෙකු දන්නේ නම් ඔහුගේ කරුණ කටයුතු භාර නීතිපතිවරුන්, නායකයින් හා සෑම ප්‍රදේශයකම පිහිටුවා ඇති අල්ලාහ්ගේ නීතිය අනුව තීන්දු ලබා දෙන ආගමික කොමිසම් මධ්‍යස්ථානවලට දැනුම් දීමය. එසේ සිදු වූ විටෙක ඔවුන්ගේ නපුරෙන්, ඔවුන්ගේ අර්බුදයෙන් හා

ඔවුන් අයුතු ලෙස ජනතාවගේ මුදල් හොරා කෑමෙන් මුස්ලිම්වරු ආරක්ෂා කර ගත හැකි වන්නේය.

උදව් පතනු ලබන්නා අල්ලාහ්ය. අල්ලාහ්ගෙන් තොරව කිසිදු හැරීමක් හෝ බලයක් හෝ නැත.

# හූනියම් සඳහා වූ ආගමික ප්‍රතිකාර

**ප්‍රශ්නය:** කවරෙකු තමන්ට හූනියම් කර ඇතැයි සිතන්නේ ද, ඔහු මසන් කොළ සතක් ගෙන ඒවා වතුර භාජනයක දමා ඒ මත කුල් අඌදු බිරබ්බිල් ෆලක් හා කුල් අඌදු බිරබ්බින් නාස් යන සූරාවන් දෙක, ආයතුල් කුර්සී නම් වදන් පෙළ, සූරා කුල් යා අය්යුහල් කාෆිරූන්, වමා අන්සල අලල් මලකයින් බිබාබිල හාරූත වමාරූත්(23) යන යන පාඨය, සූරතුල් ෆාතිහා යනාදිය පාරායනය කළ යුතු යැයි විද්වතෙකු කර ඇති ප්‍රකාශයකට මම සවන් දී ඇත්තෙමි. එහි නිවැරදිතාව කුමක් ද? තමන්ට හූනියම් කර ඇති බව සිතන්නෙකු සිදු කළ යුත්තේ කුමක් ද? අපට ප්‍රයෝජනවත් ආකාරයේ පිළිතුරක් දෙන්න. අල්ලාහ් ඔබට සෙත සලසා දෙත්වා!

**පිළිතුර:** සැබැවින් ම හූනියම පවතින්නක් බවට කිසිදු සැකයක් නැත. එවායින් අතැම් දෑ මායා කාරීය. එය සිදු වන්නේත් බලපාන්නේත් සර්වබලධාරී අල්ලාහ්ගේ අනුමැතියෙනි. මායාකරුවන් පිළිබඳ උත්තරීතර අල්ලාහ් මෙසේ පවසා සිටියි. සුලෙයිමාන්ගේ පාලන සමයේ ෂෙයිතානුන් පාරායනා කළ දෑ ඔවුහු අනුගමනය කළෝය. සුලෙයිමාන් ප්‍රතික්ෂේප නො කළේ ය. නමුත් ෂෙයිතාන්හු ප්‍රතික්ෂේප කළෝය. ඔවුහු ජනයා ට හූනියම ද, බැබිලෝනියාවේ හාරූත් මාරූත් යන මලක් වරුන් දෙදෙනා ට පහළ කරනු ලැබූ දෑ ද, ජනයා ට ඉගැන් වූවෝය. ඉන් අදහස් කර සිටියේ: මලක්වරුන් දෙදෙනාය. **“නමුත් ඔවුන් දෙදෙනා සැබැවින් ම “අපි පරීක්ෂණයකි. එබැවින් නුඹ ප්‍රතික්ෂේප නො කරනු“යි පවසා සිටීමෙන් මිස කිසිවෙකු ට ඉගැන්නුවේ නැත.**

**එවිට ඔවුන් දෙදෙනාගෙන් සැමියා හා තම බිරිය අතර වෙන් කරන දෑ ඉගෙන ගත්තෝය. අල්ලාහ්ගේ අනුබලයෙන් මිස කිසිවෙකු ට කිසිවකින් හානි පමුණුවන්නන් ලෙස ඔවුන් නැත."**

හූනියම ව්නාහි එයට බලපෑමක් ඇත. නමුත් එය අල්ලාහ්ගේ නියමයේ අනුමැතියෙන් සිදුවන්නකි. අල්ලාහ්ගේ තීන්දුවෙන් ඔහුගේ නියමයෙන් මිස එයට පැවැත්මක් නැත. එනමුත් මෙම හූනියමට ප්‍රතිකාරයක් මෙන් ම බෙහෙත් ද, ඇත. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්හට ද, මෙය සිදු විය. එවිට අල්ලාහ් එතුමාණන්ව එයින් මුදවා ගත්තේය. එහි හානියෙන් එතුමාණන්ව ආරක්ෂා කළේය. හූනියම් කරු සිදු කළ දෑ ඔවුහු සොයා ගත්තෝය. පසුව එය ගනු ලැබ, විනාශ කර දමනු ලැබීය. අල්ලාහ් ඔහුගේ නබිවරයාව (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) එයින් නිදහස් කළේය. නූලක ගැට ගැසීම හෝ එකිනෙක අමුණමින් කටු ගැසීම හෝ එවැනි හූනියම්කරු විසින් සිදු කර ඇති යමක් සොයා ගනු ලැබූ විටෙක, එය විනාශ කර දැමිය යුතුව ඇත. සැබවින්ම හූනියම් කරුවන්ගේ විෂයය වනුයේ ඔවුන්ගේ නපුරු අරමුණු සඳහා ගැට මත පිඹීම හා ඒ මත ගැට ගැසීමය. අල්ලාහ්ගේ අනුමැතියෙන් ඔවුන් සිතූ දෑ පූර්ණවත් වනු ඇත. ඇතැම් විට නිශ්ඵල වී යනු ඇත. එහෙයින් අපගේ පරමාධිපතියාණන් සියලු දෑ කෙරෙහි බලවත්ය. විටෙක හූනියම් කරනු ලැබූ තැනැත්තා ඔහුගේ බුද්ධිමට්ටම සිහියෙන් පැවතුනු විට ඔහු විසින් කුර්ආනය පාරායනය කිරීම තුළින් හෝ තවත් විටෙක වෙනත් කෙනෙකු ඔහු මත කියවා ඔහුගේ පපු පෙදෙසට හෝ ඔහුගේ ශරීර අවයව අතරින් එක් අවයවයක හෝ පිඹ ප්‍රතිකාර කළ හැකිය. එහිදී ඔහු: සූරා අල් ෆාතිහා, ආයතුල් කුර්සීය්යි, කුල් හුවල්ලාහු අහද්, මුඅව්විදතයින් නම් ආරක්ෂාව පතන සූරාවන් දෙක,

සූරා අඃරාෆ්, සූරා යූනුස් හා සූරා තාහා හි සඳහන් හූනියම හා බැඳුණු පාඨ කියවයි. සූරා අඃරාෆ්හි සඳහන් උත්තරීතර අල්ලාහ්ගේ පාඨය මෙසේය.

**وأوحينا إلى موسى أن ألق عصاك فإذا هي تلقف ما يأفكون. فوقع الحق وبطل ما كانوا يعملون. فغلبوا هنالك وانقلبوا صاغرين**

“වඅව්හයිනා ඉලා මූසා අන් අල්කි අසාක ෆඉදා හිය තල්කෆු මා යඃෆිකූන්. ෆවකඅල් හක්කු වබතල මා කානූ යඃමලූන්. ෆගලබූ හුනාලික වන්කලබූ සාගිරීන්.”

(තේරුම: තවද, ‘නුඹ නුඹේ සැරයටිය දමනු’ යැයි අපි මූසා වෙත දන්වා සිටියෙමු. එවිට එය ඔවුන් සිදු කළ විජ්ජාවන් ගිල දැමීය. එවිට සත්‍ය ස්ථාපිත විය. තවද, ඔවුන් සිදු කරමින් සිටි දෑ නිෂ්ඵල විය. එවිට එහි ඔවුන් පරාජයට පත් කරන ලදී. තවද, ඔවුහු පහත් වූවන් ලෙස පත් වූවෝය.)

සූරා යූනුස්හි සඳහන් සුවිශුද්ධයාණන්ගේ ප්‍රකාශය වනාහි:

**وقال فرعون ائتوني بكل ساحر عليم. فلما جاء السحرة قال لهم موسى ألقوا ما أنتم ملقون. فلما ألقوا قال موسى ما جئتم به السحر إن الله سيبطله إن الله لا يصلح عمل المفسدين. ويحق الله الحق بكلماته ولو كره المجرمون**

“වකාල ෆිර්අවුන උඃතූනී බිකුල්ලි සාහිරින් අලීම්, ෆලම්මා ජාඅස් සහරතු කාල ලහුම් මූසා අල්කූ මා අන්තුල් මුල්කූන්. ෆලම්මා අල්කව් කාල මූසා මා ජිඃතුම් බිහීස් සිහ්රු ඉන්නල්ලාහ සයුබ්තිලුහූ, ඉන්නල්ලාහ ලා

යුස්ලිහු අමලල් මුෆ්සිදීන්. වයුහික්කුල්ලාහුල් හක්ක බිකලිමාතිහීවලව් කරිහල් මුජ්රිමූන්.”

(තේරුම: තවද, ‘මනා දැනුම ඇති සෑම හූනියම්කරුවකුම මා වෙත නුඹලා ගෙන එනු’යි ෆිර්අවුන් පැවසුවේය. හූනියම්කරුවෝ පැමිණි කල්හි ‘නුඹලා හෙළන්නට සිටින දෑ නුඹලා හෙළනු’ යැයි මූසා ඔවුනට කීවේය. ඔවුන් හෙළූ කල්හි ‘නුඹලා කවර දෙයක් ගෙන ආව ද, එය හූනියමකි. නියත වශයෙන් ම අල්ලාහ් එය නිෂ්ඵල කරනු ඇත. නියත වශයෙන් ම අල්ලාහ් කලහකාරීන්ගේ ක්‍රියාව විධිමත් නො කරනු ඇත’ යැයි මූසා පැවසුවේය. වැරදිකරුවෝ පිළිකුල් කළ ද, අල්ලාහ් ඔහුගේ ප්‍රකාශයන් මඟින් සත්‍ය සනාථ කරනු ඇත.)

සූරා තාහා හි සඳහන් සුවිශුද්ධයාණන්ගේ ප්‍රකාශය වනාහි:

**قالوا يا موسى إما أن تلقي وإما أن نكون أول من ألقى. قال بل ألقوا فإذا حبالهم وعصيهم يخيل إليه من سحرهم أنها تسعى. فأوجس في نفسه خيفة موسى. قلنا لا تخف إنك أنت الأعلى. وألق ما في يمينك تلقف ما صنعوا إنما صنعوا كيد ساحر ولا يفلح الساحر حيث أتى**

කාලූ යා මූසා ඉම්මා අන් තුල්කිය වඉම්මා අන් නකූන අව්වල මන් අල්කා. කාල බල් අල්කූ, ෆඉදා හිබාලුහුම් වඉසිස්යුහුම් යුකයියලු ඉලයිහ් මින් සිහ්රිහිම් අන්නහා තස්ආ. ෆඅව්ජස ෆී නෆ්සිහී කීයෆතන් මූසා. කුල්නා ලා තකෆ් ඉන්නක අන්තල් අව්ලා වඅල්කි මා ෆී යමීනික තල්කෆ් මා සනඋ, ඉන්නමා සනඋ කයිදු සාහිරින් වලා යුෆ්ලිහුස් සාහිරු හයිසු අතා.

(තේරුම: අහෝ ! මූසා, එක්කො නුඹ (මුලින්ම) හෙළිය යුතුය. එසේ නැතහොත් හෙළන්නන්ගෙන් මුල් අය අප වන්න දැයි ඔවුහු පැවසුවෝය. 'එසේ නම් නුඹලා හෙළනු' යැයි ඔහු පැවසුවේය. එවිට ඔවුන්ගේ ලණු හා ඔවුන්ගේ සැරයටි විය. ඔවුන්ගේ හූනියම හේතුවෙන් ඒවා ගමන් කරන මෙන් දිස් විය. එවිට මූසාට, ඔහුගේ සිත තුළ බිය හැඟීමක් එය ඇති කළේය.නුඹ බිය නො වනු. නියත වශයෙන් ම උසස් වනුයේ නුඹ ම යැයි අපි පැවසුවෙමු. නුඹේ දකුණතෙහි ඇති දෑ නුඹ හෙළනු. ඔවුන් සිදු කළ දෑ එය ගිල දමනු ඇත. එසේ ඔවුන් සිදු කළේ හූනියම්කරුවකුගේ කුමන්ත්‍රණයයි. හූනියම්කරුවා කවර අයුරින් පැමිණිය ද, ජය නො ලබනු ඇත.)

තවදුරටත් සූරා "කුල් යා අය්යුහල් කාෆිරූන්" එහි අවසානය දක්වාත්, සූරා "කුල් හුවල්ලාහු අහ්ද්", "කුල් අඌදු බිරබ්බිල් ෆලක්", "කුල් අඌදු බිරබ්බින් නාස්" යන සූරාවන් ද, පාරායනය කරයි. වඩාත් උචිත වනුයේ සූරා කුල් හුවල්ලාහු අහ්ද් හා මුඅව්වදතයින් නම් ආරක්ෂාවේ සූරාවන් දෙක නැවත නැවතත් තුන්වරක් පාරායනය කොට පසුව ඔහු වෙනුවෙන් සුවය ඉල්ලා ප්‍රාර්ථනා කිරීමය.

**اللهم رب الناس أذهب البأس وأشف أنت الشافي لا شفاء إلا شفاؤك شفاءً لا يغادر سقما**

"අල්ලාහුම්ම රබ්බන් නාසි, අද්හබිල් බඃස, වෂ්ෆි. අන්තෂ් - ෂාෆී, ලා ෂිෆාඅ ඉල්ලා ෂිෆාඅක ෂිෆාඅන් ලා යුගාදිරු සකමා" යනුවෙන් තුන්වරක් පවසයි."

(තේරුම: අහෝ මිනිසුන්ගේ පරමාධිපතියාණනි! දුක් කරදර පහ කරන්නාණනි! ඔබ සුවය දෙනු මැනව. සුවය දෙන්නා ඔබය. ඔබ හැර සුවය දෙන්නකු වෙනත් නැත. එය මනා සුවයකි. එය රෝගී ලෙස අතහැර නො දමයි.)

**بسم الله أرقيك من كل شيء يؤذيك ومن شر كل نفس أو عين حاسد الله يشفيك بسم الله أرقيك**

"බිස්මිල්ලාහි අර්කීක මින් කුල්ලි ෂෙයිඉන් යුඃදීක, වමින් ෂර්රි කුල්ලි නෆ්සින් අව අයිනින් හාසිදින්. අල්ලාහු යෂ්ෆීක බිස්මිල්ලාහි අර්කීක" යනුවෙන් තුන්වරක් මෙම ප්‍රාර්ථනාව තුළින් ආරක්ෂාව පතයි.

(තේරුම: අල්ලාහ්ගේ නාමයෙනි, ඔබට හිංසා ඇති කරන සෑම දෙයකින් ම, සෑම ආත්මයකින් ම එමෙන් ම ඊර්ෂ්‍යා කරන සෑම ඇස්වහකින් ම මම ඔබට ආරක්ෂාව පතමි. අල්ලාහ් ඔබ සුවපත් කරත්වා! අල්ලාහ්ගේ නාමයෙන් මම ඔබට රැකවරණය පතමි.) පසුව සුවය හා ආරෝග්‍යය සඳහා ඔහු වෙනුවෙන් ප්‍රාර්ථනා කරයි. එසේ ආරක්ෂාව පැතීමේ දී

**أعيذك بكلمات الله التامات من شر ما خلق**

"උඊදුක බිකලිමාතිල්ලාහිත් තාම්මාති මින් ෂර්රි මා කලක්" යනුවෙන් ප්‍රාර්ථනා කර සිටීම යහපත් වන්නේය.

(තේරුම: අල්ලාහ් මැවූ සියලු දෑහි හානියෙන් ආරක්ෂාව මම ඔහුගේ පරිපූරණ වදන් තුළින් පතමි.)

මේ සියල්ල ප්‍රයෝජනවත් ප්‍රතිකාර අනුවාද වේ. මෙම ආරක්ෂිත අනුවාද හා ප්‍රාර්ථනාවන් ජලයේ පාරායනය කර පසුව එයින් හූනියම් කරනු ලැබූ පුද්ගලයා පානය කොට, ඉන් ඉතිරි ජලයෙන් ස්නානය කළේ නම්, එය අල්ලාහ්ගේ අනුමැතියෙන් සුවය හා ආරෝග්‍යය ලැබීමට හේතු සාධකයක් වන්නේය. අමු මසන් කොළ හතක් කොටාගත් පසු එය ජලයට දැමුවේ නම් එය ද, සුවය ලබන්නට හේතු සාධකයක් වනු ඇත. මෙම ප්‍රතිකාර ක්‍රමය බොහෝ දුරට උත්සාහ කර බලා ඇති අතර එමගින් අල්ලාහ් ඵල ලබා දී ඇත. බොහෝ ජනයාට අප මෙම ප්‍රතිකාරය සිදු කර ඇත්තෙමු. එමඟින් අල්ලාහ් ඔවුනට ප්‍රයෝජන සළසා ඇත. මෙය ඉතා ප්‍රයෝජනවත් මෙන් ම හූනියම් කරනු ලැබූ අයහට සෙත සළසන ප්‍රතිකාර ක්‍රමයකි.

මෙලෙසම තම බිරියගෙන් වළක්වනු ලැබූ පුද්ගලයාට මෙම ප්‍රතිකාරය වඩාත් ප්‍රයෝජනවත් වන්නේය. හේතුව ඇතැම් ජනයා තම බිරිය සමඟ සංසර්ගයේ යෙදීමෙන් වළක්වනු ලැබ ඇත. ඇය සමඟ සංසර්ගයේ යෙදීමට ශක්තිය ඔවුන් නො දරයි. මෙම ආරක්ෂිත අනුවාද හා ප්‍රාර්ථනාවන් භාවිත කරන විට අල්ලාහ්ගේ අනුමැතියෙන් ඔහුට එහි ප්‍රතිඵල හිමි වනු ඇත. එය ඔහු තමන් විසින් ම පාරායනය කළ ද, වෙනත් අය ඔහු මත පාරායන කළ ද, ජලයේ එය පාරායනය කර පසුව ඉන් පානය කොට ඉතිරියෙන් ස්නානය කළ ද, එක සමානය. අල්ලාහ්ගේ අනුමැතියෙන් හූනියම් කරනු ලැබූ තැනැත්තාට බිරියගෙන් වළක්වනු ලැබූ තැනැත්තාට මේ සියල්ල ප්‍රයෝජනවත් වන්නේය. මේවා භෞතික සාධක වේ. සුවිශුද්ධ වූ උත්තරීතර අල්ලාහ් පමණය සුවය ලබා දෙන්නා. ඔහු සියලු දෑ කෙරෙහි සර්වබලධාරීය. රෝගය මෙන් ම ප්‍රතිකාරය උත්තරීතර වූ කීර්තිමත් ඔහු අතෙහි පමණක් ඇත්තේය.

සියල්ල සුවිශුද්ධයාණන්ගේ තීන්දුව හා නියමය අනුව සිදුවන්නකි. අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ පවසා ඇත්තාහ. "**කිසියම් රෝගයක් අල්ලාහ් පහළ කර ඇත්නම් ඒ සඳහා වූ ප්‍රතිකාරය ද, අල්ලාහ් පහළ කර මිස නැත. එය දන්නා එය ගැන දනියි. එය ගැන නොදන්නා එය ගැන නො දනී.**"

මෙම භාග්‍යය සුවිශුද්ධ වූ උත්තරීතර අල්ලාහ්ගෙනි. ඍජු මාර්ගය වෙත මග පෙන්වන්නා හා ආශිර්වාද කරන්නා අල්ලාහ්ය.

# ජින්වරුන් මිනිස් වර්ගයා තුළ ඇතුළු වීමේ යථාර්ථය පැහැදිලි කිරීම එය ප්‍රතික්ෂේප කරන්නන්හට වූ ප්‍රතිචාරය.

සියලු ප්‍රශංසා අල්ලාහ් සතුය. ශාන්තිය හා සමාදානය ධර්ම දූතයාණන් හටත් එතුමාණන්ගේ පවුලේ උදවිය හටත් එතුමාණන්ගේ සහගාමීන් හටත් එතුමාගේ මග පෙන්වීමෙන් මඟ ලැබූ අය හටත් උදාවේවා!

පහත දැක්වෙන්නේ... මේ වසරේ (මා සිතන පරිදි හිජ්රි වර්ෂ 1407) ෂාබාන් මාසයෙහි පළ වූ සමහර දේශීය පුවත්පත් සහ වෙනත් ප්‍රකාශනවල සඳහන් කර තිබූ (රියාද්හි ඇතැම් මුස්ලිම් කාන්තාවන්ට ආරූඪ වී සිටි) සමහර ජින්වරුන්ගේ ප්‍රකාශවලින් උද්ගත වූ ඇතැම් කෙටි හා දිගු සිදුවීම් කිහිපයකි. ඔහු මා අභියස ඉස්ලාමය පිළිගත්තේ රියාද්හි වෙසෙන අබ්දුල්ලාහ් බින් මුෂර්රෆ් අල්-උමරි සොහොයුරාට ප්‍රකාශ කිරීමෙන් පසුවය. එතුමා ඉහත කී පාරායනයන් එසේ ආරූඪ වූ කාන්තාව මත කියවා ජින්වරයා ඇමතීමෙන් පසු ඔහුට දෙවියන්ව මතක් කර අනුශාසනා කර අයුක්තිය හා අසාධාරණය තහනම් බව සහ මහා පාපයක් බව දන්වා සිටියේය. එම ජින්වරයා දේවත්වය ප්‍රතික්ෂේප කරන අයෙකු බව ඔහුට දන්වා ඇති අතර ඇයගෙන් බැහැර වන මෙන් ඔහු ඉල්ලා සිටියේය. පසුව එම ඇරයුම ජින්වරයා පිළිගෙන ඔහුගේ ඉස්ලාමය අබ්දුල්ලා ඉදිරියේ දැනුම් දී තිබුණේය. පසුව, නම් සඳහන් කරනු ලැබූ අබ්දුල්ලාහ් හා එම කාන්තාව එම කාන්තාවගේ භාරකරුවන් සමඟ පැමිණ, එම ජින්වරයා තම ඉස්ලාමය දන්වා, එය මා අසන්නට සළස්වන්නට ඔවුහු ප්‍රිය කළෝය. එසේ ඔවුන් මා වෙත පැමිණ පසු ඔහු

ඇය තුළට ආරූඪ වීමේ හේතුව කුමක් දැ?යි මම ඔහුගෙන් විමසා සිටියෙමි. එවිට ඔහු විවිධ කාරණා මට දැනුම් දුන්නේය. එම කාන්තාව මුවින් කතා කළ ද, එය ඇයගේ කට හඬ නො ව පිරිමියකුගේ කටහඬ මෙන් විය. මා ළඟ පුටුවක සිටි ඇය අසලින් ඇයගේ සහෝදරයා හා ඇයගේ සහෝදරිය මෙන් ම අබ්දුල්ලා ඉබ්නු මුෂර්රෆ් ද, සිටි අතර එම ජින්වරයාගේ ප්‍රකාශයට සවන් දී ඒ ගැන සාක්ෂි දරණ විද්වතුන් පිරිසක් ද, සහභාගී වූවෝය. ඔහුගේ ඉස්ලාමය ඉතා පැහැදිලිව දැනුම් දුන්නේය. ඔහු ආගමික වශයෙන් ඉන්දියානු අන්‍ය ආගමික අයෙකු බව දන්වා සිටියේය. පසුව මම ඔහුට උපදෙස් දුනිමි. අල්ලාහ් පිළිබඳ මතකයෙන් පසුවන මෙන් ද, එම කාන්තාවගෙන් බැහැර වී ඇයට සිදුවන අපරාධයෙන් දුරස් වන මෙන් ද, මම අනුශාසනා කර සිටිමි.

ඒ සඳහා ඔහු මට ප්‍රතිචාර දැක්වා මෙසේ පැවසීය: සැබැවින් ම මම ඉස්ලාමය පිළිගන්නෙක්මි. තවදුරටත් අල්ලාහ් ඔහුට යහමග ලබා දුන් පසුව ඔහුගේ සමූහයා ද ඉස්ලාමය වෙත ඇරයුම් කරන මෙන් ද, මම ඔහුට අනුශාසනා කළෙමි. ඔහු යහපත් ලෙසින් පොරොන්දු විය. කාන්තාවගෙන් වෙන් වී ගියේය. ඇය ප්‍රකාශ කළ අවසන් වදන වූයේ: අස්සලාමු අලයිකුම් යන්නයි. පසුව එම කාන්තාව සුපුරුදු පරිදි කතා කරන්නට ගත්තාය. ඔහුගේ පීඩාවෙන් ඇය සැනසුම හා ආරක්ෂාව ලැබූ බවක් ඇයට හැඟින. පසුව මාසයක් හෝ ඊට වඩා වැඩි කාලයක් ගතවීමෙන් පසු ඇය ඇයගේ සහෝදරයන් දෙදෙනා, ඇයගේ මාමා හා ඇයගේ සහෝදරිය සමඟ මා වෙත පැමිණියෝය. ඇය යහතින් හා සුවයෙන් සිටින බව ඇය මට දන්වා සිටියාය. පසුව ඔහු නැවතත් ඇය වෙත පැමිණ සිටියේ නැත. සියලු ප්‍රශංසා අල්ලාහ් සතුය. ඔහු ඇය තුළ ආරූඪ වන මෙහොතේ ඇයට හැඟුණේ කෙසේදැ?යි මම ඇයගෙන්

විමසා සිටියෙමි. එවිට ඇය ආගමට පටහැනි ඉතා පහත් සිතුවිලි තමන්ට හැඟුණු බවත් බුදු දහමට නැඹුරුවන්නාක් මෙන් හා එහි සම්පාදනය කරනු ලැබූ පොත් දෙස බැලීමේ ආශාවක් දැනෙන්නට වූ බවත් ඇය පිළිතුරු දෙමින් දන්වා සිටියාය. ඇයව ඔහුගෙන් අල්ලාහ් මුදවා ගැනීමෙන් පසු එම සිතුවිලි ඇයගෙන් ඉවත් වී තිබිණ. ව්‍යාකූල එම සිතුවිලිවලින් දුරස් වී ඇයගේ මුල් තත්වයට ඇය හැරුණාය.

මෙවන් සිදුවීම් තමන් හෙළා දකින බවත් සැබැවින් ම එය රැවටීමක් හා බොරුවක් බවත් ඇය එය නො පැවසුව ද, ඇය සමඟ එය පටිගත කරන ලද ප්‍රකාශයක් වන්නට ද, ඉඩ ඇති බවත් ගරු අෂ්-ෂෙයික් අලී අත්-තන්තාවී තුමා මට දන්වා සිටියේය. එතුමාගේ ප්‍රකාශය පටිගත කළ තැටියක් මම ඉල්ලා සිටියෙමි. එතුමා පවසා සිටි දෑ මම වටහා ගතිමි. මම නොයෙකුත් ප්‍රශ්න ජින්වරයාගෙන් අසා, ඔහු එයට පිළිතුරු දී තිබුණ ද, එම පටිගතයේ ඔහු විස්තර කර තිබූ 'මෙය පිළිකුල් සහගත වරදකි. එමෙන් ම ව්‍යාජ අවසර දීමකි' යනාදී කරුණු බොහෝමයක් ගැන මම පුදුමයට පත් වූයෙමි. එනම් ඔහුගේ ප්‍රකාශයෙන් තව දුරටත් වැටහෙන්නේ සැබැවින් ම ජින්වරයෙකු මිනිසකුගේ අතින් ඉස්ලාමය වැළඳ ගැනීම සුලෙයිමාන් සම්බන්ධ කතා පුවතෙහි උත්තරීතර අල්ලාහ් පවසා ඇති ප්‍රකාශයට පටහැනිය යන්නයි. **"තවද, මගෙන් පසු ව කිසිවකුට අයිති නො වන රාජ්‍යයක් මට පිරිනමනු මැනව!"** මෙය ද, ඔහු අතින් සිදු වූ වරදක් බවටත් එය ව්‍යාජ වැටහීමක් බවටත් කිසිදු සැකයක් නැත. අල්ලාහ් ඔහුට මඟ පෙන්වා දෙත්වා. ජින්වරයෙක් මිනිස් අතින් ඉස්ලාමය වැළඳ ගැනීම සුලයිමාන්ගේ ඇරයුමට පටහැනි දෙයක් නො වේ. ජින්වරුන්ගෙන් විශාල පිරිසක් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාගේ අතින් ඉස්ලාමය වැළඳ ගෙන ඇත.

ඒ ගැන අල්ලාහ් අල්-අහ්කාෆ් හා අල් ජින් යන අල් කුර්ආනීය පරිච්ඡේදවල පැහැදිලි කර ඇත. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා ප්‍රකාශ කළ බවට අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ හදීසයක් මෙසේ බුහාරි හා මුස්ලිම්හි සඳහන් වී ඇත. එතුමා මෙසේ පැවසූහ. **"සැබැවින් ම ෂෙයිතාන් මා අවහිර කොට මා වෙත අනිවාර්යය වූ සලාතය කප්පාදු කිරීමට දැඩි සේ උත්සාහ කළේය. ඔහු සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා අල්ලාහ් මට ඉඩ සලසා දුන්නේය. පසුව මම ඔහුව හිරකර දැමුවෙමි. නුඹලා අවදි වන තෙක් කණුවක ඔහු බැඳ දමන්නට සිතුවෙමි. මාගේ සහෝදර සුලෙයිමාන් (අලයිහිස් සලාම්) තුමාගේ ප්‍රකාශය මට මතක් විය. "මාගේ පරමාධිපතියාණනි! මට ඔබ සමාව දෙනු මැනව! තවද, මගෙන් පසු ව කිසිවකුට අයිති නො වන රාජ්‍යයක් මට පිරිනමනු මැනව!"පසුව අල්ලාහ් ඔහුව නින්දාවට පත් කළේය."** මෙය ඉමාම් බුහාරි තුමා සතු ප්‍රකාශයකි. ඉමාම් මුස්ලිම් තුමාගේ ප්‍රකාශය වනාහි, **"ජින්වරුන් අතර සිටි දුෂ්ට ජින්වරුවෙකු මාගේ සලාතය විනාශ කිරීම සඳහා පෙරදින රාත්‍රියේ මට බාධා කරන්නට විය. සැබැවින් ම අල්ලාහ් ඔහු සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා මට අවස්ථාව ලබා දුන්නේය. පසුව මම ඔහුව හිර කළෙමි. නුඹලා සියලු දෙනා ම අවදි වී ඔහුව දැකිය හැකි පරිදි මස්ජිදයේ කණු අතරින් එක් කණුවක බැඳ දමන්නට මම සිතුවෙමි. පසුව මාගේ සහෝදර සුලෙයිමාන්ගේ ප්‍රකාශය මට මතක් විය. "මාගේ පරමාධිපතියාණනි! මට ඔබ සමාව දෙනු මැනව! තවද, මගෙන් පසු ව කිසිවකුට අයිති නො වන රාජ්‍යයක් මට පිරිනමනු මැනව!" පසුව අල්ලාහ් ඔහුව නින්දාවට පත් කළේය."**

ඉමාම් බුහාරි තුමාගේ රීති අනුකූලව ඉමාම් නසාඊ තුමා ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය විසින් වාර්තා කළ හදීසයක් මෙසේ වාර්තා කරයි: **"සැබැවින් ම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා සලාතය ඉටු කරමින් සිටියේය. එවිට ෂෙයිතාන් එතුමා වෙත පැමිණියේය. පසුව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ ඔහුව බිම දමා ඔහුගේ ගෙල මිරිකාගෙන සිටියහ. අල්ලාහ්ගේ දූතයාණෝ (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා මෙසේ ප්‍රකාශ කළහ. ඔහුගේ දිවෙහි සීතල මාගේ අතට දැනෙන තරමටම විය. සුලෙයිමාන්ගේ ප්‍රාර්ථනාව නො වී නම්, ජනයා ඔහුව දැකිය හැකි වන පරිදි මා ඔහු ගැට ගසා තබන්නට තිබුණි."** අහ්මද් හා අබූ දාවූද් යන ඉමාම්වරු විසින් අබූ සර්ද් තුමා වාර්තා කළ හදීසයක් මෙසේ වාර්තා කර ඇත. **"එහි... මහපට ඇඟිල්ල හා එයට පරව පිහිටි ඇඟිල්ල යන ඇඟිලි දෙක අතර ඔහුගේ කෙළවල සීතල මට දැනෙන තරමට මම ඔහුගේ ගෙල මාගේ අතින් හිරකරමින් සිටියෙමි."** ඉමාම් බුහාරි තුමා ඔහුගේ සහීහ් ග්‍රන්ථයේ වාර්තා කර ඇත. ග්‍රන්ථය: අල්-ෆත්හ්, වෙළුම 4 පිටුව 487.

අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා මෙසේ වාර්තා කරයි. **"රමළාන් මාසයේ zසකාත් භාණ්ඩ ආරක්ෂා කිරීම සඳහා අල්ලාහ්ගේ දූතයාණන් මා පත් කළේය. මා වෙත කෙනකු පැමිණ ඔහු ආහාර අහුරා ගන්නට විය. පසුව මම ඔහුව හසු කර ගෙන, "අල්ලාහ් මත දිවුරා පවසමි. සැබැවින් ම මම නුඹව අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා වෙත ගෙනයමි." යැයි පැවසුවෙමි. ඔහු: "ඇත්තෙන් ම මම අවශ්‍යතා ඇත්තෙක්මි. මට පවුලක් ඇත. මම දැඩි අවශ්‍යතාවකින් පෙළෙමි." යැයි පැවසීය. පසුව මම ඔහුව නිදහස් කළෙමි. මම උදෑසන අවදි වූයෙමි. එවිට අල්ලාහ්ගේ දූතයාණන් "අහෝ අබූ හුරෙයිරා! පෙර**

දින රාත්‍රියේ ඔබේ සිරකරුවා සමඟ කටයුතු කළේ කෙසේදැ?'යි විමසා සිටියහ. මම "අල්ලාහ්ගේ දූතයාණනි! ඔහු දැඩි අවශ්‍යතා ඇත්තෙකු බවත් ඔහුට පවුලක් සිටින බවත් පවසා මට කණ්ණලව් කළේය." එහෙයින් මම ඔහුට අනුකම්පා කොට ඔහුගේ මාර්ගයේ යන්නට නිදහස් කළෙමි. එතුමා: "සැබැවින් ම ඔහු නුඹට බොරු පවසා ඇත. ඔහු නැවත පැමිණෙනු ඇත." යැයි පවසා සිටයහ. අල්ලාහ්ගේ දූතයාණන් ප්‍රකාශ කර ඇති බැවින් සැබැවින් ම ඔහු නැවත එන බව මම දැනගෙන සිටිමි. මම ඔහුව රැකගෙන සිටියෙමි. පසුව ඔහු (නැවතත්) ආහාර අහුරා ගන්නට පැමිණියේය. එවිට මම ඔහුව අල්ලා ගෙන, සැබැවින් ම මම නුඹව අල්ලාහ්ගේ දූතයාණන් වෙත ගෙන යමි යැයි පැවසුවෙමි. එවිට ඔහු: මා අත්හරින්න. සැබැවින් ම මම අවශ්‍යතා ඇත්තෙක්මි. මට පවුලක් ඇත. මම නැවත නො එමි යැයි පැවසීය. පසුව මම ඔහුට අනුකම්පා කොට ඔහුගේ මාර්ගයේ යන්නට මම ඔහු නිදහස් කළෙමි. උදෑසන උදාවීමෙන් පසු අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා "අහෝ අබූ හුරෙයිරා! ඔබ පෙර දින රාත්‍රියේ ඔබේ සිරකරුවා සමඟ කටයුතු කළේ කෙසේ ද?" යැයි විමසූහ. අල්ලාහ්ගේ දූතයාණනි, දැඩි අවශ්‍යතාවෙන් ඔහු පෙළෙන බවත් ඔහුට පවුලක් ඇති බවත් මට කණ්ණලව් කර සිටියේය. එහෙයින් ම මම ඔහුට අනුකම්පා කොට ඔහුගේ මාර්ගයේ යන්නට මම ඔහු නිදහස් කළෙමි. යැයි පැවසුවෙමි. එතුමා: "සැබැවින් ම ඔහු නුඹට බොරු පවසා ඇත. ඔහු නැවතත් එනු ඇත." යැයි පැවසුවේය. මම තුන්වන වරටත් රැකගෙන සිටියෙමි. එසේ ඔහු පැමිණ ආහාර අහුරා ගන්නට විය. මම ඔහුව අල්ලාගෙන මම නුඹව අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) වෙත ගෙන යමි යැයි පැවසුවෙමි. මෙය අවසානයයි. නුඹ

තුන්වරක් ම නැවත නො එන බවට විශ්වාසයෙන් පැවසුවෙහිය පසුව නුඹ නැවත පැමිණියෙහිය. යැයි පැවසුවෙමි. ඔහු: ඔබ මා අත් හරින්න. අල්ලාහ් ඔබට සෙත සලසන වදන් කිහිපයක් මම නුඹට උගන්වන්නම් යැයි පැවසීය. එවිට මම එවා මොනවාදැ?යි විමසුවෙමි. ඔහු: ඔබ ඔබේ නිදි යහනට පැමිණි විට ආයතුල් කුර්සී: අල්ලාහු ලා ඉලාහ ඉල්ලා හුවල් හය්යුල් කය්යූම් යන පාඨයේ අවසානය දක්වා පාරායනය කරන්න. එවිට අල්ලාහ්ගෙන් වූ ආරක්ෂකයකු ඔබ මත වන්නේමය. උදෑසන දක්වා ෂෙයිතාන් ඔබට සමීප නො වනු ඇත. පසුව මම ඔහුගේ මාර්ගයේ යන්නට නිදහස් කළෙමි. මම උදෑසන අවදි වීමෙන් පසු අල්ලාහ්ගේ දූතයාණන්: පෙර දින රාත්‍රියේ ඔබේ සිරකරුවා ඔබ සමඟ කටයුතු කළේ කෙසේ ද? යැයි විමසු සිටියහ. මම: අල්ලාහ්ගේ දූතයාණනි, අල්ලාහ් මට සෙත සළසන වදන් කිහිපයක් මට ඔහු උගන්වා සිටියේය. එහෙයින් මම ඔහුගේ මාර්ගයේ යන්නට නිදහස් කළෙමි යැයි පැවසුවෙමි. එතුමා “ඒ කුමක් ද?” යැයි විමසූහ. මම: ඔහු මට “ඔබ ඔබේ නිදියහනට ගියේ නම් ආයතුල් කුර්සීය ආරම්භයේ සිට පාඨය අවසන් වන තෙක් ම පාරායනය කරන්න: අල්ලාහු ලා ඉලාහ ඉල්ලා හුවල් හය්යුල් කය්යූම්. තවදුරටත් ඔහු මට: අල්ලාහ්ගෙන් වූ ආරක්ෂකයකු ඔබ මත නිරන්තරයෙන් ම සිටිනු ඇත. උදෑසන වන තෙක් ෂෙයිතාන් ඔබට සමීප වන්නේ නැත යැයි පවසා සිටියේය. - සහාබාවරුන් වන ඔවුහු යහපත තිබෙන යමක් සිදු කිරීමට වඩාත් ආසාවෙන් පසුවූවෝය. එවිට නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා (සැබැවින් ම ඔහු මහා බොරුකාරයෙකු වුවද නුඹට සත්‍ය පවසා ඇත. අහෝ අබූ හුරෙයිරා රාත්‍රී තුනක පටන් ඔබ කතා කළ එම පුද්ගලයා

**හඳුනන්නෙහි ද? යැයි විමසා සිටියහ. මම: නැතැයි පිළිතුරු දුනිමි. එතුමාණෝ "එය ෂෙයිතාන් වේ." යැයි පැවසූහ.**

සෆිය්යා (රළියල්ලාහු අන්හා) තුමිය විසින් වාර්තා කළ බුහාරි හා මුස්ලිම් යන විද්වතුන් දෙපළ විසින් දන්වා ඇති සහීහ් හදීසයක නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා මෙසේ දන්වා සිටියි. එතුමාණෝ: **"සැබැවින් ම ෂෙයිතාන් ආදම්ගේ දරුවාගේ රුධිරය ගලායන ස්ථානයන්හි ගමන් කරයි"** යනුවෙන් පැවසූහ. ඉමාම් අහ්මද් සිය මුස්නද් ග්‍රන්ථයේ වෙළුම 4 පිටුව 216 නිවැරදි වාර්තා සම්බන්ධතාවක් සහිතව වාර්තා කර ඇත. සැබැවින් ම උස්මාන් ඉබ්නු අබුල් ආස් (රළියල්ලාහ් අන්හු) තුමාණෝ මෙසේ පැවසූහ: **"අල්ලාහ්ගේ දූතයාණනි! මා අතර හා මාගේ සලාතය අතරත් මාගේ පාරායනය අතරත් ෂෙයිතාන් වෙන් කළේය. එතුමා: "එය ෂෙයිතාන්ය. ඔහුට කන්සබ් යනුවෙන් පවසනු ලැබේ. ඔබ ඔහුව දැනෙන විට ඔහුගෙන් ආරක්ෂාව අල්ලාහ්ගෙන් පතා ඔබේ වම් පැත්තට හැරී තුන් වරක් කෙළ ගසන්නාක් මෙන් අඟවන්න." යැයි පැවසූහ. ඔහු: එය මම සිදු කළෙමි. එවිට කීර්තිමත් උත්තරීතර අල්ලාහ් ඔහුව මගෙන් පහකර හැරියේය.**

පූර්ව සාධක සහිත හදීස්වල සඳහන් වී ඇති පරිදි, නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ පවසා ඇත්තාහ. **"සැබැවින් ම සෑම මිනිසෙකු සමඟ ම මලක්වරුන් අතරින් සමීපතයෙකු ද, ෂෙයිතානුන් අතරින් සමීපතයෙකු ද, සිටියි"**. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ට පවා එසේ විය. නමුත් එම ෂෙයිතාන්ට එරෙහිව අල්ලාහ් එතුමාණන්ට උදව් කළේය. එවිට ඔහු ඉස්ලාමය පිළිගත් අතර යහපත මිස වෙනකක් නියෝග කළේ නැත.

මනුෂ්‍යයා තුළ ජින් ප්‍රවේශ වී, ඔහුව විනාශ කර දමනු ඇතැයි යන්නට අල්ලාහ්ගේ ග්‍රන්ථය, ඔහුගේ දූතයාණන්ගේ සුන්නාව හා සමාජයේ ඒකමතික මත සාධක පෙන්වා තිබිය දී ඒ ගැන කිසිදු දැනුමකින් හෝ මගපෙන්වීමකින් තොරව දැනුම මත පමණක් පදනම් වූ අය එය හෙළා දැකිය හැක්කේ කෙසේ ද? එය අහ්ලුස් සුන්නා හා වල් ජමාආ වාසීන්ට විරුද්ධව කටයුතු කරන ඇතැම් නව්‍යකරණ වාදීන් අනුගමනය කරමිනි. පිහිට පතනු ලබන්නා අල්ලාහ්ය. අල්ලාහ්ගෙන් තොරව කිසිදු හැරීමක් හෝ බලයක් හෝ නොමැත. අල්ලාහ්ගේ අභිමතය අනුව, අහෝ පාඨක ඔබට වඩාත් පහසුවෙන් කියවිය හැකි පරිදි විද්වතුන්ගේ ප්‍රකාශ කිහිපයක් මම මෙහි සිහි ගන්වමි.

**පහත සඳහන් උත්තරීතර අල්ලාහ්ගේ ප්‍රකාශය සම්බන්ධයෙන් අල්කුර්ආන් අටුවාචාරීන්ගේ ප්‍රකාශ පැහැදිළි කිරීම."පොලිය අනුභව කරන්නවුන් ෂෙයිතාන් ස්පර්ශ කිරීමෙන් ඔහුගේ ප්‍රහාරයට ලක් වූ කෙනෙකු මෙන් මිස (කියාමත් දින) නො නැගිටින්නෝය. "**

උත්තරීතර අල්ලාහ්ගේ එම ප්‍රකාශය විස්තර කිරීමේදී අබූ ජඃෆර් ඉබ්නු ජරීර් (රහිමහුල්ලාහ්) මෙසේ පවසයි. පොලිය අනුභව කරන්නවුන් ෂෙයිතාන් ස්පර්ශ කිරීමෙන් ඔහුගේ ප්‍රහාරයට ලක් වූ කෙනෙකු මෙන් මිස (කියාමත් දින) නො නැගිටින්නෝය. මෙම කියමනෙන් අදහස් කරනුයේ මෙලොවෙහි ෂෙයිතාන් ඔහුට දෙන පහරයි. ඔහු (ස්පර්ශ කිරීම හේතුවෙන්) එනම් උමතුවට ලක් කිරීම හේතුවෙන් ඔහුගේ ගෙල හිර කර ඔහුව විනාශ කර දමනු ඇත යන්නයි.

සඳහන් කරන ලද පාඨය විස්තර කිරීමේදී ඉමාම් අල් බගවී (රහිමහුල්ලාහ්) තුමා මෙසේ පවසයි. **"පොලිය අනුභව කරන්නවුන් ෂෙයිතාන් ස්පර්ශ කිරීමෙන් ඔහුගේ ප්‍රහාරයට ලක් වූ කෙනෙකු මෙන් මිස (කියාමත් දින) නො නැගිටින්නෝය."** එනම්: උමතුභාවයයි. මිනිසාව ස්පර්ශ කිරීම යනු ඔහු උමතු වූ විටෙක 'ෂෙයිතාන් වැහී ඇතැ'යි කියනු ලැබේ.

සඳහන් කරන ලද පාඨය විස්තර කිරීමේ දී ඉමාම් ඉබ්නු කසීර් (රහිමහුල්ලාහ්) තුමා මෙසේ පවසයි. "පොලිය අනුභව කරන්නවුන් ෂෙයිතාන් ස්පර්ශ කිරීමෙන් ඔහුගේ ප්‍රහාරයට ලක් වූ කෙනෙකු මෙන් මිස (කියාමත් දින) නො නැගිටින්නෝය" එනම්: මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ ඔවුන්ගේ මිනීවලවලින් ඔවුන් අවදි කරනු ලබන විට විකෘති තත්වයේ අපස්මාර රෝගියෙකු අවදිවෙන්නාක් මෙන් මිස නො පවතී. ෂෙයිතාන් ඔහුට වැළඳී ඇත්තාක් මෙනි. එය සැබැවින් ම ඔහු නැගිටින පිළිකුල් සහගත අවදි වීමකි. ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හු) තුමා මෙසේ පවසයි: **"පොළිය අනුභව කරන්නා මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ හුස්ම හිර කර ගන්නා පිස්සෙකු සේ අවදි කරනු ලැබේ."** මෙය ඉබ්නු අබී හාතම් විසින් වාර්තා කර ඇත.

එමෙන් ම අවුෆ් ඉබ්නු මාලික්, සඊද් ඉබ්නු ජුබෙයිර්, අස්-සදී, අර්-රබී ඉබ්නු අනස්, කතාදා, මුකාතිල් ඉබ්නු හය්යාන් වැනි උතුමන්ලා විසින් ද, වාර්තා කර ඇත. එතුමාගේ ප්‍රකාශයේ අපේක්ෂිත කරුණු අවසන්ය.

උත්තරීතර අල්ලාහ්ගේ ප්‍රකාශය විස්තර කිරීමේදී අල්-කුර්තුබී (රහිමහුල්ලාහ්) තුමා මෙසේ පවසයි: **"පොලිය අනුභව කරන්නවුන්**

**ෂෙයිතාන් ස්පර්ශ කිරීමෙන් ඔහුගේ ප්‍රහාරයට ලක් වූ කෙනෙකු මෙන් මිස (කියාමත් දින) නො නැගිටින්නෝය."** ජින් පාර්ශවයෙන් ඇතිවන ව්‍යාකූලත්වය හෙළා දකින, සැබැවින් ම එය ඉබේ සිදු වන්නක් බවත් මිනිසා තුළ ෂෙයිතාන් ගමන් නො කරන බවත් ඔහුගෙන් කිසිදු ස්පර්ශයන් ඇති නො වන බවත් විශ්වාස කරන දනන් හට එසේ හෙළා දැකීමේ අපරාධයට එරෙහිව වන සාධකයක් මෙම පාඨයේ සඳහන්ව ඇත. මෙම අර්ථයෙහි අල් කුර්ආන් අටුවාචාරීන්ගේ ප්‍රකාශ බොහෝමයක් ද, ඇත. එය සොයන්නාට ලබා ගත හැකිය.

"ඊලාහුද් දලාලා ෆී උමූමිර් රිසාලා ලිස්-සකලයින්" නම් කෘතියෙහි ෂයිහුල් ඉස්ලාම් ඉබ්නු තය්මිය්යා (රහිමහුල්ලාහ්) තුමා මෙසේ පවසයි. මජ්මූඋල් ෆතාවා 19 වැනි වෙළුම 9 වැනි පිටුවේ සිට 65 වන පිටුව දක්වා ඉහත සඳහන් ප්‍රකාශයෙන් පසු එහි සඳහන් කරුණු දැක ගන්නට හැකිවේ. **"එබැවින් මුඃතසිලා පාර්ශවයේ "අල් ජබාඉයි", "අබූ බක්ර් අර්-රාසී" හා වෙනත් කණ්ඩායම් අපස්මාර රෝගී ශරීරයක ජින්වරුන් ප්‍රවේශ වීම හෙළා දකින නමුත් ජින්වරුන් සිටින බවට ඔවුන් ප්‍රතික්ෂේප නො කළෝය. ඔවුන් එහි වැරදි මත දරන්නන් වුව ද, මෙය ප්‍රසිද්ධියේ දකින්නට නො වන්නාක් සේ අල්ලාහ්ගේ දූතයාණන් විසින් වාර්තා කරන ලද ප්‍රකාශයේ ද, ප්‍රසිද්ධියේ දැක ගන්නට නො වීය."**

අෂ්අරී තුමා අහ්ලුස් සුන්නා වල් ජමාආ මත දරන්නන්ගේ ලිපිවල "සැබැවින් ම ජින්වරුන් අපස්මාර රෝගය ඇත්තන්ගේ ශරීරය තුළට පිවිසෙනු ඇතැයි පවසා සිටියේ එබැවිනි. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි. **"පොලිය අනුභව කරන්නවුන් ෂෙයිතාන් ස්පර්ශ කිරීමෙන් ඔහුගේ ප්‍රහාරයට ලක් වූ කෙනෙකු මෙන් මිස (කියාමත් දින) නො**

**නැගිටින්නෝය."** අබ්දුල්ලාහ් ඉබ්නු අහ්මද් ඉබ්නු හන්බල් තුමා තම පියාණන්ට **"සැබැවින් ම ජින්වරුන් මිනිස් ශරීරය තුළට ප්‍රවේශ නො වන බවට පිරිසක් දැඩි සේ විශ්වාස කරති." යැයි පවසා සිටියහ. එවිට ඔහු: "මාගේ පුතනුවනි, එසේ දිවෙන් කතා කරන්නන් බොරු පවසති. එහි මාතෘකාව පුළුල් එකකි."** එතුමා තව දුරටත් සඳහන් කර ඇති කරුණු "අල් ෆතාවා: 24 වැනි වෙළුමෙහි 276,277 වැනි පිටුවල මෙසේ සඳහන් වී ඇත. **"ජින්වරුන්ගේ පැවැත්ම අල්ලාහ්ගේ ග්‍රන්ථයේ හා සුන්නාවේ ස්ථිරව පවතින එමෙන් ම ප්‍රජාවේ පෙරටුගාමීන් හා ඔවුන්ගේ නායකයින් ඒ ගැන ඒකමතිකව පළ කර ඇති කරුණකි. එමෙන් ම මිනිස් ශරීරය තුළ ජින්වරුන් ප්‍රවේශ වීම ද, අහ්ලුස් සුන්නා වල් ජමාආ ඉමාම්වරුන්ගේ ඒකමතික ප්‍රකාශ අනුව එය තහවුරු වූ කරුණකි. පොලිය අනුභව කරන්නවුන් ෂෛයිතාන් ස්පර්ශ කිරීමෙන් ඔහුගේ ප්‍රහාරයට ලක් වූ කෙනෙකු මෙන් මිස (කියාමත් දින) නො නැගිටින්නෝය."** පූර්ව සාධක සහීහ් හදීසයක නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා: **"සැබැවින් ම ෂෛයිතාන් ආදම්ගේ දරුවාගේ රුධිරය ගලායන ස්ථානයන්හි ගමන් කරයි"** යැයි පවසා ඇත්තාහ.

අබ්දුල්ලාහ් ඉබ්නුල් ඉමාම් අහ්මද් ඉබ්නු හන්බල් තුමා: "මම මාගේ පියාණන්ට සැබැවින් ම ජින්වරුන් අපස්මාර රෝගයෙන් තොරව ප්‍රවේශ වන්නේ නැත යැයි පවසන පිරිසක් සිටිති, යැයි පවසා සිටියෙමි. එවිට එතුමා මාගේ පුතණුවනි, ඔවුන් බොරු පවසති. එය ඔවුන්ගේ දිව කතා කරන දෑය." ඔහු පවසා සිටින දෑ ප්‍රසිද්ධ කරුණකි. සැබැවින් ම පුද්ගලයකු අපස්මාර රෝගයට පත් වී ඔහුට තේරුමක් නො වැටහෙන කතාවෙන් කතා කරයි. ඔහුගේ ශරීරයට බලවත් සේ පහර දෙයි. එයින් ඔටුවකුට පහර දුන්නේ නම් පවා එමඟින් දරුණු සළකුණු හට ගැනෙනු

ඇත. මේ සමඟ අපස්මාර රෝගියා ඔහුට අත්වන ප්‍රහාරය ගැන හෝ ඔහු කතා කරන කතාව ගැන හෝ ඔහුට වැටහෙන්නේ නැත. එම අපස්මාර රෝගියාව අපස්මාර රෝගී නො වන වෙනත් අයකු විසින් ඇද දමනු ලැබ ඇත.

ඔහු වාඩි වී සිටින ඇතිරිල්ල අදියි. උපකරන වටේට ගමන් කරයි. තැනකින් තවත් තැනකට විතැන් වෙයි. මේ හැර දකින වෙනත් කරුණු ද, ගමන් කරවයි. සැබැවින් ම මිනිස් දිවෙන් කතා කරන්නා හා එම ශරීරය ක්‍රියා කරවන්නා මිනිස් නො වන වෙනත් වර්ගයක් බව අතිශයින් ම එය දැනුවත් කර සිටියි.

අපස්මාර තත්වයට පත් ශරීරයක ජින්වරයෙකු ප්‍රවේශ වීම ගැන හෙළා දකින උදවිය මුස්ලිම් නායකයින් අතර නැත. කවරෙකු එය හෙළා දැක සැබැවින් ම ෂරීආව එය බොරුවක් බව පවසන්නේ යැයි වාද කරන්නේ ද, සැබැවින් ම ඔහු ෂරීආවට එරෙහිව බොරු පවසා ඇත. එසේ නැතැයි පවසන කරුණු ෂරීආවෙහි සාධක තුළ දක්නට නැත.

ඉබ්නු කය්යුම් (රහිමහුල්ලාහ්) ඔහුගේ “Zසාදුල් මආද් ෆී හද්යි කයිරිල් ඉබාද්” නම් කෘතියෙහි 4 වැනි වෙළුමේ 66-69 දක්වා පිටුවල සඳහන් කරුණු මෙසේය. අපස්මාර තත්වය යනු කරුණු දෙකකි. මිහිතලයේ නපුරු ආත්මාවන් තුළින් අපස්මාර තත්වයට පත්වීම හා නින්දිත බැඳියාව හේතුවෙන් අපස්මාර තත්වයට පත්වීමයි. දෙවැන්න වෛද්‍යවරුන් ඒ සඳහා හේතු කතා කරන එය සුව කිරීමට බලන අපස්මාර තත්වයයි.

**ආත්මාවන් හා බැඳුණු අපස්මාර තත්වය වනාහි:** ඔවුන්ගේ නායකයින් මෙන් ම බුද්ධිමතුන් එය පිළිගන්නා අතර ඔවුන් එය වළක්වන්නට නො බලති. සැබැවින් ම එය උසස් ශ්‍රේෂ්ඨ යහපත් ප්‍රාණ නින්දිත නපුරු ප්‍රාණවලට අනුගත වීම තුළින් එයට ප්‍රතිකර්මයක් වන බව පිළිගනිති. ඒවායෙහි බලපෑම් වළක්වා ඒවායෙහි ක්‍රියාකාරකම්වලට විරුද්ධ කටයුතු කර පසුව එය නිෂ්ඵල කරති. ඒ ගැන ඇතැම් පොත්වල සඳහන් කර ඇති අතර අපස්මාර රෝගය සුව කිරීමේ ක්‍රම ද, මෙනෙහි කර ඇත. තවදුරටත් ඔහු: සැබැවින් ම බැඳීම් හා භෞතික වස්තූන් හේතුවෙන් ඇති වූ අපස්මාර තත්වයට එය ප්‍රයෝජනවත් වනු ඇත. යැයි පවසා සිටියි.

**ආත්මාවන් හේතුවෙන් සිදුවන අපස්මාර තත්වය වනාහි,** මෙම ප්‍රතිකාර ක්‍රමය එහි දී ප්‍රයෝජනවත් වන්නේ නැත. සැබැවින් ම නූගත් වෛද්‍යවරුන් හා ඔවුනට පහළින් සිටින්නන් මෙන් ම මිත්‍යාව උතුම් යැයි විශ්වාස කරන්නන් පිළිබඳ වනාහි, ඔවුහු ආත්මාවන්ගෙන් ඇතිවන අපස්මාර තත්වය හෙළා දකිති. අපස්මාර රෝගී තත්තවය ඇති ශරීරය තුළ එය බලපෑම් ඇති කරන බව පිළිනො ගනිති. ඔවුන් තුළ අඥානකම මිස වෙනකක් නැත. එසේ නැතහොත් වෛදකම් තුළ එය වළක්වන කිසිවක් නැත. හැඟීම හා පැවැත්ම එයට සාක්ෂි දරන්නකි. ඇතැම් බැඳීම් ඉක්මවා යන්නට එය ඔවුන් යොමු කරනු ඇත. ඇතැම් අංශවල එය සැබෑවක් වුවද සියලු දෑහි එසේ නො වනු ඇත. පවසන පරිදි: වෛද්‍යවරුන් අතර මිත්‍යාදෘෂ්ටික අදහස් ඇත්තෝ පැමිණි විට බැඳීමෙන් ඇතිවන අපස්මාරය පමණක් මිස ඔවුන් වෙනකක් සහතික කර සිටියේ නැත. එම ආත්මාවන් ගැන ඒවායෙහි බලපෑම් ගැන වැටහීමක් හා අවබෝධයක් ඇත්තන් ඒ ගැන නොදන්නා වැටහීමක්

නැති අය සම්බන්ධයෙන් සිනහසෙනු ඇත. මෙම වර්ගයට ප්‍රතිකාර සිදු කිරීම කරුණු දෙකකින් විය යුතුය.: අපස්මාර තත්වයට පත් වූ අයගේ පැත්තෙන් පවතින කරුණ හා ප්‍රතිකාර කරන්නාගේ පැත්තෙන් පවතින කරුණය. අපස්මාර තත්වයේ පසුවන අයගේ පැත්තෙන් සිදු විය යුතු කරුණ වනාහි, ඔහුගේ සිත බලවත් කර ගත යුතු වේ. මෙම ආත්මාවන් මවා උත්පාදනය කළ අය වෙත සැබෑ ලෙසින් නැඹුරු විය යුතු වේ. සිත හා දිව බැඳුණු නිවැරදි ක්‍රමයට ආරක්ෂාව පැතිය යුතු වේ. සැබැවින් ම මෙය සටන් වර්ගයකි. සටන් කරන්නා වනාහි, ඔහුගේ සතුරාට ආයුධ එසවීම හේතුවෙන් කරුණු දෙකක් මත මිස සාධාරණත්වය ඔහුට පූර්ණවත් වන්නේ නැත. එනම් ආයුධය පැවැත්මෙන් ඉතා හොඳ නිවැරදි තත්වයේ පිහිටිය යුතුය. එමෙන් ම එසේ උදව්වට ගන්නා ද බලවත් විය යුතුය. ඒ දෙකින් එකක් කවර මොහොතක පසුබට වන්නේ ද, එසේ ආයුධ අමෝරණ බහුතරයකට එය ප්‍රයෝජනවත් වන්නේ නැත. මේ කරුණු දෙක ම නො වී නම් කෙසේ විය හැකි ද?

ඒකීයකරණය, විශ්වාසය, බිය බැතිමත්භාවය, තෘප්තිය යනාදියෙන් සිත හිස්ව යනු ඇත. එයට කිසිදු ආයුධයක් අවශ්‍ය වන්නේ නැත.

**ප්‍රතිකර්මය පැත්තෙන් දෙවැනි කරුණ:** එහි තවත් කරුණු දෙකක් ඇතුළත් වේ. එනම් "නුඹ එයින් පිටව යනු" එසේ නැතහොත් "අල්ලාහ්ගේ නාමයෙන්" එසේ නැතහොත් "ලා හව්ල වලා කුව්වත ඉල්ලා බිල්ලාහ්" යනුවෙන් පැවසීමෙන් පමණක් රෝගය සුව කරන තරමට එය පවතී. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) මෙසේ පවසන්නෙකු වූහ. අල්ලාහ්ගේ සතුර නුඹ බැහැරව යනු මම අල්ලාහ්ගේ දූතයා වෙමි.

අපගේ ෂෙයික්තුමා ආත්මය සමඟ කතා කරන අයකු අපස්මාර රෝගියෙකු වෙත එවා සිටිනු මම දැක ඇත්තෙමි. හෙතෙම: "ෂෙය්ක්තුමා නුඹ බැහැර වී යනු. නුඹට මෙය සුදුසු ස්ථානයක් නො වේ." යැයි නුඹට පවසා සිටියි යැයි පවසා සිටියේය. එවිට අපස්මාර තත්වයෙන් පෙළෙන්නා පැහැදිලි තත්වයට පත් වෙයි. ඇතැම් විට ඔහුගේ ආත්මය සමඟ කතා කරයි. ඇතැම් විට එය දුෂ්ඨ ආත්මයක් වන්නට පුළුවන එවිට පහර දීමෙන් එය බැහැර කරයි. පසුව අපස්මාර රෝගියා පැහැදිලි තත්වයට පත් වෙයි. ඔහුට වේදනාවක් දැනෙන්නේ නැත. මෙය වාර ගණනාවක් ම අප මෙන් ම තවත් අය ද, දැක ඇත්තෙමු. හෙතෙම මෙසේ පැවසීය. සමස්තයක් වශයෙන් මෙම අපස්මාර වර්ගය හා එය සුව කිරීම දැනුමෙන් බුද්ධියෙන් හා වැටහීමෙන් අඩු අය මිස හෙළා නො දකිනු ඇත. නපුරු ආත්මාවන් බොහෝ සෙයින් ඔවුන් මත ආධිපත්‍ය දරනුයේ ඔවුන්ගේ දහම පිළිබඳ පවතින අඩු දැනුම හා ඔවුන්ගේ හදවත් හා ඔවුන්ගේ දිවවල් දේව විශ්වාසය හා නබිත්වය සමඟ බැඳුණු යහපත් කටයුතු, දුආ ප්‍රාර්ථනාවන් හා දික්ර් පිළිබඳ වන යථාර්තයන්ගෙන් හිස්ව තිබීමය. එහෙයින් නිරායුධ මිනිසෙකු වෙත නපුරු ආත්මය හමු වන්නේය. ඇතැම් විට නිරුවතින් සිටින විට, එහි දී එය බලපානු ඇත. එතුමාගේ ප්‍රකාශයේ අපේක්ෂිත කොටස අවසන්.

අපි මතක් කර සිටි ආගමික සාධක තුළින් හා අහ්ලුස් සුන්නා වල් ජාමාඅත් වරුන් අතර සිටින දැනුමැත්තන්ගේ ඒකමතික මතය තුළින් ජින්වරුන් මිනිස් වර්ගයා තුළට ප්‍රවේස වීමට හැකියාව ඇතැයි පෙන්වා දෙයි. එය හෙළා දකින ෂෙයික් අලී අත්-තන්තාවීගේ වැරැද්ද හා එය හෙළා දකින්නන්ගේ ප්‍රකාශයේ ඇති ව්‍යාජ බව පාඨකයාට මෙයින් පැහැදිලි වන්නේය.

සැබැවින් ම හෙතෙම ඔහුගේ ප්‍රකාශයේ සත්‍ය වෙත මග පෙන්වන ලැබුවේ නම් ඒ වෙත තමන් යොමුවන බවට පොරොන්දු වී තිබිණ. අප මේ සඳහන් කර ඇති දෑ ඔහු කියවීමෙන් පසු ඇතැම් විට නිවැරදි දෑ වෙත ඔහු යොමුවන්නට පුළුවන. අපටත් ඔහුටත් යහමග හා ආශිර්වාදය අල්ලාහ්ගෙන් පතන්නෙමු.

තවදුරටත් අප සඳහන් කර සිටියේ හිජ්රි 1407/10/14 වන දින පළවුණු නද්වා නම් සඟරාවේ 8 වැනි පිටුවේ වෛද්‍ය මුහම්මද් ඉර්ෆාන් විසින් වාර්තා කර ඇති ප්‍රකාශයකි. **"සැබැවින් ම උම්මත්තතභාවය යන පදය වෛද්‍ය ශබ්දකෝෂයෙන් අතුරුදන් වී ඇති එකකි."** ඔහුගේ විශ්වාසය වනුයේ, සැබැවින් ම ජින්වරුන් මිනිසා තුළ ප්‍රවේශ වීම, ඔහුගේ හඬින් කතා කිරීම යනු සියයට සියයක්ම බුද්ධිමය වශයෙන් වැරදි වටහා ගැනීමක් යන්නය. මේ සියල්ල ආගමික කරුණු පිළිබඳ හා අහ්ලුස් සුන්නා හා වල් ජමාආත් මතදාරීන්ගේ විද්වතුන් විසින් පිළිගත් කරුණු පිළිබඳ පවතින අඩු දැනුම හේතුවෙන් ඇති වූ ව්‍යාජ අදහස්ය. මෙම කරුණු බොහෝ වෛද්‍යවරුන්ට සැඟවුණු කරුණක් බවට පත් වී තිබුණ ද, එය නැතැයි යන්නට සාධකයක් නො වීය. එනමුත් ආගමික කටයුතු පිළිබඳ මනා දැක්මක් ඇති, විශ්වාසනීය හා සත්‍ය බවින් ප්‍රචලිත විද්වතුන් දැන සිටින කරුණු පිළිබඳ ඔවුන්ගේ අඥාන බව පෙන්වා දෙයි. නමුත් එය අහ්ලුස් සුන්නා වල් ජමාඅත් වරුන්ගේ නම් ඒකමතික මතය වේ. එය ෂෙයිකුල් ඉස්ලාම් ඉබ්නු තයිමිය්යා සියලු ම විද්වතුන් පිළිබඳ දන්වා සිටි පරිදිය. එමෙන් ම අබුල් හසන් අල් අෂ්අරී විසින් ද, ඒ ගැන දන්වා ඇති අතර, අහ්ලුස් සුන්නා වල් ජමාආත්වරුන් විසින් දන්වා ඇත. එමෙන් ම ආචාර්ය අබුල් හසන් අල් අෂ්අරීතුමා ද, මේ ගැන දන්වා

සඳහන් කර ඇත. ඔහු නමින් අබ්දුල්ලාහ් මුහම්මද් ඉබ්නු අබ්දුල්ලාහ් අෂ්-ෂිබ්ලී අල්-හනෆී (විපත හිජ්රි වර්ෂ 799)
ඔහුගේ ග්‍රන්ථය: “ආකාමුල් මර්ජාන් ෆී ගරාඉබිල් අක්බාර් වඅහ්කාමුල් ජාන්” 51 වන පාඩම.

ඉබ්නු කය්යුම් (රහිමහුල්ලාහ්) තුමාගේ ප්‍රකාශය පෙර සඳහන් කෙරිණ. සැබැවින් ම වෛද්‍ය ප්‍රධානීන් හා ඔවුන් අතර සිටින බුද්ධිමතුන් එය පිළිගනිති. නමුත් එය වළක්වන්නට නො බලති. සැබැවින් ම එය හෙළා දකිනුයේ වෛද්‍යවරුන් අතර දැනුමක් නැති ඔවුන් අතර සිටින පහත් අය හා මිත්‍යාදෘෂ්ටිකයින්ය. එය පාඨක ඔබ දැනගත යුතුය. එමෙන් ම අපි සඳහන් කළ සත්‍ය පිළිපැදිය යුතුය. අඥාන වෛද්‍යවරුන් හෝ වෙනත් කිසිවකු හෝ නිසාවෙන් ඔබ රැවටීමට භාජනය නො විය යුතුය. එමෙන් ම මෙම කරුණ සම්බන්ධයෙන් කිසිදු දැනුමක් හෝ කිසිදු සාධයක් හෝ නො දැන කතා කරන; ඒ ගැන දැනුම නැති වෛද්‍යවරුන් අන්ධ ලෙස අනුකරණය කරන; සත්‍යයෙන් බැහැර වූ ජනයා අතරින් ඇතැම් නව්‍යකරණවාදීන් හා වෙනත් අය නිසාවෙන් ද, ඔබ රැවටීමට භාජනය නො විය යුතුය. උපකාරය පතනු ලබන්නා අල්ලාහ්ය.

# අවධානය පිණිසය.

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් විසින් වාර්තා කළ බොහෝ හදීස් අප සඳහන් කළ කරුණුවලට සාධකව පිහිටා ඇත. එමෙන් ම ජින්වරුන් සමඟ කතා කිරීම, ඔහුට උපදෙස් දීම ඔහුට කරුණු සිහිපත් කර දීම, ඉස්ලාමය වෙත ඇරයුම් කිරීම, එයට ඔහු පිළිතුරු දීම යනාදිය සම්බන්ධයෙන් වූ විද්වතුන්ගේ ප්‍රකාශ ද, සාධකව පිහිටා ඇත. එය සූරා “සාද්’ හි සුලෙයිමාන් අලයිහිස් සලාම් තුමා ගැන උත්තරීතර අල්ලාහ් කළ ප්‍රකාශයට විරුද්ධවූවක් නො වන්නේය. “මාගේ පරමාධිපතියාණනි! මට ඔබ සමාව දෙනු මැනව! තවද, මගෙන් පසු ව කිසිවකුට අයිති නො වන රාජ්‍යයක් මට පිරිනමනු මැනව!” එමෙන් ම ඔහුට යහපත නියෝග කිරීම හා අයහපතින් වැළැක්වීම, ඔහු බැහැර වීමෙන් වැළකී සිටින විට ඔහුට පහර දීම යනාදි සියල්ල සඳහන් කරන ලද පාඨයට විරුද්ධ නො වන්නේය. නමුත් එය අනිවාර්යය වන්නේය. මිනිසුන් සමඟ කටයුතු කරන්නාක් සේම යදින්නා වැළැක්වීම, අපරාධකරුට උදව් කිරීම, යහපත් දෑ නියෝග කිරීම, පිළිකුල් සහගත දැයින් වැළැක්වීමට යනාදී ක්‍රියාවන් ඇතුළට එය ප්‍රවේශ වන්නකි. පෙර සඳහන් පූර්ව සාධක හදීසයේ සඳහන්ව ඇති පරිදි සැබැවින් ම නබි (සල්ලල්ලාහු අලය්හි වසල්ලම්) තුමාණන් මෙසේ ප්‍රකාශ කර ඇත. **“ඔහුගේ කෙළ හැළෙන තෙක් ෂෙයිතාන්ව මම හිර කළෙමි” එය ගෞරවණීය (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ අත මත විය. තවදුරටත් එතුමා මෙසේ පැවසීය: මාගේ සහෝදර සුලෙයිමාන්ගේ ප්‍රාර්ථනාව නො වී නම් මිනිසුන් ඔහුව උදෑසන දකින තෙක් ගැට ගසනු ලබන්නට තිබිණි.”**

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා ප්‍රකාශ කළ බව අබූ දර්දා තුමා විසින් වාර්තා කළ හදීසයක් ඉමාම් මුස්ලිම් සතු වාර්තාවක මෙසේ සඳහන් වෙයි. **"සැබැවින් ම අල්ලාහ්ගේ සතුරා වන ඉබ්ලීස් ගිනි පෙනැල්ලක් රැගෙන ඇවිත් මාගේ මුහුටණ දමන්නට තැත් කළේය. එවිට මම ඔබෙන් ආරක්ෂාව අල්ලාහ්ගෙන් පතමි. යැයි පැවසුවෙමි. පසුව අල්ලාහ්ගේ පූර්ණ ශාපය මම තුන් වරක් ඔබට ඉල්ලා ශාප කරමි. (එය ප්‍රමාද නො වීය.) පසුව මම ඔහුව අල්ලා ගන්නට සිතුවෙමි. අල්ලාහ් මත දිවුරමි. අපගේ සහෝදර සුලෙයිමාන්ගේ ප්‍රාර්ථනාව නො වී නම්, මදීනා වාසී දරුවන් ඔහු සමඟ සෙල්ලම් කරන පරිදි ගැට ගසනු ලබන්නට තිබිණි. මෙම අර්තයෙන් යුත් හදීස් බොහෝමයක් ඇත. විද්වතුන්ගේ ප්‍රකාශ ද මෙලෙස ම විය."**

අපි සඳහන් කළ කරුණුවල දී සත්‍ය සොයන්නන්හට ප්‍රමාණවත් තරමට කරුණු ඇතැයි අපි අපේක්ෂා කරමු. අල්ලාහ්ගේ අලංකාර නාම ඔහුගේ උසස් ගුණාංග තුළින් අපටත් සෙසු මුස්ලිම්වරුන්ටත් ඔහුගේ දහම පිළිබඳ නිසි අවබෝධය ලබන්නටත් ඒ මත ස්ථාවරව සිටීමටත් අපට ආශිර්වාද කරත්වා! යැයි ද, කටයුතු හා කාර්යයන්වල සත්‍ය අනුව ක්‍රියාත්මක කිරීමට අප සියලු දෙනාට අල්ලාහ් දායාද කරත්වා! කිසිදු දැනුමකින් තොරව කතා කිරීමෙන් හා දැනුමක් නැති යමක් හෙළා දැකීමෙන් අප හා සියලු මුස්ලිම්වරුන් ආරක්ෂා කරන මෙන් ද, මම අල්ලාහ්ගෙන් ඉල්ලා සිටිමි. සැබැවින් ම ඔහු එයට භාරකරුය. ඒ කෙරෙහි ශක්තිවන්තය.

ශාන්තිය හා සමාදානය අපගේ රසූල්වරයා වන මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ටත් එතුමාණන්ගේ පවුලේ සාමාජිකයන්ටත් හිතමිතුරන් හා අනුගාමිකයින් හටත් හිමිවේවා!

# පටුන

පෙරවදන ........................................................................................ 3

හූනියම හා ජෝතිෂ්‍ය පිළිබඳ නීති මෙන් ම ඒ හා බැඳුණු කරුණු. ........ 6

බිරිය සැමියාට එරෙහිව හූනියම් කිරීම.... ........................................... 22

මන්ත්‍ර ගුරුකම් කරන්නන් හා හූනියම් කරුවන්ගෙන් විමසා සිටීම පිළිබඳ නීතිය. ..................................................................................26

ජින්වරුන් (අග්නි භූතයින්) යොදා ගන්නා ජන වෛද්‍යවරයකු ළඟ ප්‍රතිකාර කිරීම..........................................................................................30

හූනියම් සඳහා වූ ආගමික ප්‍රතිකාර..........................................................33

ජින්වරුන් මිනිස් වර්ගයා තුළ ඇතුළු වීමේ යථාර්ථය පැහැදිලි කිරීම එය ප්‍රතික්ෂේප කරන්නන්හට වූ ප්‍රතිචාරය. ......................................... 41

අවධානය පිණිසය................................................................................59